සටහන

2019 අප්‍රේල් - ජූනි 38 වෙළුම 04 - 06 කලාපය

2 කසකස්තානයේ සමාජ, ආර්ථික තොරතුරු බිඳක්

3 කුරුඳු ව්‍යාපාරය

17 නව සංවර්ධන බැංකුව හරිත හෙට දිනක් කරා...

24 නීතියයි ඔබයිඃ අධිකරණය ඉදිරියේ සාක්ෂිකරුවකු වන ඔබට ඇති අයිතිවාසිකම් සහ හිමිකම්

26 මුදල් විශුද්ධිකරණය සිදුවන්නේ මූල්‍ය ආයතන හරහා පමණක් නොවේ

ISSN 1391-3697

01946

9 770041 001533

රු. 20/-

ශ්‍රී ලංකා මහ බැංකුව
සන්නිවේදන දෙපාර්තමේන්තුව

කසකස්තානය

සමාජ, ආර්ථික තොරතුරු බිඳක්...

ලොව විශාලතම ගොඩබිම් රාජ්‍යය වන කසකස්තානය විශාලත්වය අතින් ලොව රටවල් අතර නව වැනි තැන ගන්නවා. ආසියාවේ පිහිටා ඇති අන්තර්මහාද්වීපික රාජ්‍යයක් ලෙස සැලකෙන මෙහි බටහිර කොටසේ වැඩි භූමි ප්‍රමාණයක් අයත් වන්නේ යුරෝපා මහාද්වීපයටයි. ඛනිජ තෙල්, වායු සහ තවත් ඛනිජමය සම්පත් රාශියකින් සමන්විත මෙම දේශය මධ්‍යම ආසියානු කලාපයේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට හැටක් පමණ නිපදවන, ආර්ථික වශයෙන් සමෘද්ධිමත් රාජ්‍යයක්. කසකස්තානු ජනරජය ලෙස නිල වශයෙන් හැඳින්වෙන මෙය උතුරෙන්, ඊසාන දෙසින් හා වයඹින් රුසියාවෙන් ද නැගෙනහිරින් සහ ගිනිකොන දෙසින් චීනයෙන් ද දකුණින් කිර්ගිස්තානයෙන් ද නිරිත දෙසින් උස්බෙකිස්තානයෙන් ද බටහිරෙන් අභ්‍යන්තර මුහුදක් වූ කැස්පියන් මුහුදෙන් ද සීමා වී තිබෙනවා. විවිධ භූ ලක්ෂණ රැසකින් සමන්විත කසකස්තානයේ තැනිතලා, තණබිම්, ගල් පර්වත, ඩෙල්ටා, හිමෙන් වැසුනු කඳු පන්තීන් පමණක් නොව කාන්තාර ද තිබෙනවා.

ඉතිහාසයේ එක් එක් යුගවල දී මොංගෝලියානු අධිරාජ්‍යය ඇතුළු විවිධ අධිරාජ්‍යයන්ට අයත් ව තිබූ කසකස්තානය 1936 දී කසාක් සෝවියට් සමාජවාදී ජනරජය නමින් සෝවියට් සංගමය හා සම්බන්ධ වුණා. 1991 දී සෝවියට් සංගමය විසුරුවා හැරීමෙන් පසු ස්වාධීන රාජ්‍යයක් ලෙස අවසාන වශයෙන් ඉන් ඉවත් වූයේ කසකස්තානයයි. ජනවර්ග රාශියක් ජීවත් වන කසකස්තානයේ ජනතාවගෙන් සියයට 70ක් පමණ ඉස්ලාම් ආගම අදහනවා. කසාක් භාෂාව රාජ්‍ය භාෂව ලෙස සැලකෙන මෙහි අගනුවර කලින් “අස්තානා” ලෙස හැඳින්වුණු නමුත් 2019 මාර්තු 23 වැනිදා සිට එය “නුර්-සුල්තාන්” ලෙස හැඳින්වෙනවා.

මූලාශ්‍ර - World Fact Book
Wikipedia විශ්වකෝෂය

භූමි ප්‍රමාණය මුළු ප්‍රමාණය වර්ග කි.මී. ගොඩ බිම් ප්‍රමාණය වර්ග කි.මී. අභ්‍යන්තර ජලාශ වර්ග කි.මී.	 2,724,900 2,699,700 25,000
ජනගහනය (2018 ජූලි ඇස්තමේන්තු)	18,744,548
ජනගහන වර්ධන වේගය (2018 ජූලි ඇස්තමේන්තු)	0.98%
උපත් අනුපාතය (2018 ඇස්තමේන්තු) (ජනගහනය දහසකට)	17.5
මරණ අනුපාතය (2018 ඇස්තමේන්තු) (ජනගහනය දහසකට)	8.21
ළදරු මරණ අනුපාතය (2018 ඇස්තමේන්තු) (සජීවී උපත් දහසකට)	19
උපතේ දී ජීවිත අපේක්ෂාව (අවුරුදු) (2018 ඇස්තමේන්තු)	71.4
දළ දේශීය නිෂ්පාදිතය (2017 ඇස්තමේන්තු)	එක්සත් ජනපද ඩොලර් බිලියන 159.4
මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය (2017 ඇස්තමේන්තු)	4%
ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (2017 ඇස්තමේන්තු)	එක්සත් ජනපද ඩොලර් 26,300
දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය (2017 ඇස්තමේන්තු) කෘෂිකර්මය කර්මාන්ත සේවා	 4.7% 34.1% 61.2%
ශ්‍රම බලකාය (2017 ඇස්තමේන්තු)	මිලියන 8.97
සේවා වියුක්තිය (2017 ඇස්තමේන්තු)	5%
කුටුම්භ ආදායමේ ගිනි සංගුණකය (2013 ඇස්තමේන්තු)	26.3
අයවැය අතිරික්තය (+) හෝ හිඟය (-) (2017 ඇස්තමේන්තු) දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස	-1.8%
උද්ධමන අනුපාතය (2017 ඇස්තමේන්තු)	7.4%
ආනයන (2017 ඇස්තමේන්තු)	එක්සත් ජනපද ඩොලර් බිලියන 31.85
ආනයන භාණ්ඩ	යන්ත්‍රෝපකරණ, ලෝහමය නිෂ්පාදන, ආහාර ද්‍රව්‍ය
අපනයන (2017 ඇස්තමේන්තු)	එක්සත් ජනපද ඩොලර් මිලියන 49.29
අපනයන භාණ්ඩ	තෙල් හා තෙල් ආශ්‍රිත නිෂ්පාදන, ස්වභාවික වායු, රසායන ද්‍රව්‍ය
මුදල් ඒකකය	ටෙන්ජ් (tenge)

“සටහන” සඟරාවෙහි පළවන අදහස් ඒ ඒ ලේඛකයන් ගේ අදහස් මිස ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් නොවිය හැකි ය.

2018 ජනවාරි මාසයේ සිට "සටහන" සඟරාව පළ වන්නේ තෙමසකට වරක් බව කරුණාවෙන් සලකන්න.

ශ්‍රී ලංකා මහ බැංකුව නමට ලියන ලද මුදල් ඇණවුම්/චෙක්පත් මෙහි සඳහන් ලිපිනයට එවීමෙන් “සටහන” තැපෑලෙන් ගෙන්වා ගත හැකි ය.

පිටපතක මිල : රු. 20.00
වාර්ෂික දායකත්වය : රු. 320.00
(තැපැල් ගාස්තු ද ඇතුළත්ව)

අධ්‍යක්ෂ
සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ. පෙ. 590, කොළඹ

දකුණු ලක ආර්ථිකය සවි කරන කුරුඳු ව්‍යාපාරය

එම්.එස්. හඳුන්ගේ
ප්‍රාදේශීය කළමනාකරු
ප්‍රාදේශීය කාර්යාලය - මාතර

කුරුඳු කර්මාන්තයේ ඉතිහාසය

කුළුබඩු නිජ බිම් සොයා යෑම

ශ්‍රී ලංකාවේ කුරුඳු ශතවර්ෂ ගණනාවක් තිස්සේ ලෝකය පුරා ප්‍රචලිත ව පැවති ඇති අතර 15 වන සියවස දක්වා ම ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිට යුරෝපය දක්වා කුරුඳු වෙළෙඳාම සිදු කරන ලද්දේ වැනීසියානු වෙළෙඳුන් විසිනි. අරාබි මුස්ලිම්වරුන් විසින් ඉතා රහසිගත ව ගොඩබිම් මාර්ග ඔස්සේ ඇලෙක්සැන්ඩ්‍රියාව වෙත රැගෙන ආ කුරුඳු වැනීසියානු වෙළෙඳුන් විසින් මිලට ගෙන ඉතා අධික මිලකට යුරෝපීය වෙළෙඳපොළ වෙත අලෙවි කරන ලදි. වෙළෙඳපොළ ඉල්ලුම වර්ධනය වූ වේගයට සරිලන පරිදි සැපයුම පවත්වාගෙන යෑමට අරාබි වෙළෙඳුන් අපොහොසත් විය. මේ අතර සුළු ආසියාවේ තුර්කිවරුන් සහ ඊජිප්තුවේ මම්ලූක්ස් බලයට පත්වීමත් සමඟ එතෙක් පවත්වාගෙන ආ නිදහස් වෙළෙඳාමට බාධා එල්ල විණි. මෙම කරුණු හේතුවෙන් කුරුඳු ඇතුළු කුළුබඩු භෝගයන්හි නිෂ්පාදන ප්‍රභවයන් වෙත මුහුදු සැපයුම් මාර්ගයක් සාදා ගැනීමටත් කුළුබඩු වෙළෙඳාම තමන් අතට ගැනීමටත් බොහෝ යුරෝපීය ජාතීන් තුළ උනන්දුවක් ඇති විය. මේ හේතුවෙන් බොහෝ රටවල් කුළුබඩු නිජ බිම් සොයා දේශ ගවේෂණය සඳහා බොහෝ වෙහෙස විය. වස්කෝ ද ගාමා ඉන්දියාව සොයා ගැනීමත් කොළම්බස් ඇමරිකාව සොයා ගැනීමත් මෙම වෑයමේ ප්‍රතිපලයි.

පෘතුගීසීන්ගේ ආගමනය

කුරුඳු ඇතුළු කුළුබඩු සොයා යන ගමනේ දී අහම්බයකින් මෙන් ලොරෙන්සෝ ද අල්මේදා ඇතුළු පෘතුගීසි නාවිකයන් පළමුව ගාලු වරායටත් දෙවනුව 1505 නොවැම්බර් මස 15 වන දින කොළඹටත් පැමිණීම ශ්‍රී ලංකාවේ ඉතිහාසයට යහපත් මෙන් ම අයහපත් ප්‍රතිවිපාකයන් අත් කර දුන් සන්ධිස්ථානයක් ලෙස සඳහන් කළ යුතු ය. පෘතුගීසි පැමිණීමටත් පෙර සිට ම ශ්‍රී ලංකාවේ රජු යටතේ සංවිධානාත්මක නිෂ්පාදනයක් හා වෙළෙඳාමක් පැවතිය ද එය

වැවිලි වගාවක් ලෙසින් ව්‍යාප්ත වී නො තිබුණි. කුරුණෑගල රජකම් කළ වත්හිමි බණ්ඩාර රජතුමාගේ ඔටුනු පැළඳවීමේ මංගල්‍යය සඳහා ඉන්දියාවේ කේරළයේ සලාග්‍රාමන් නම් ප්‍රදේශයෙන් රැගෙන ආ බ්‍රාහ්මණයන් හත් දෙනෙකුගෙන් පැවතෙන්නේ යයි විශ්වාස කරනු ලබන සලාගම කුලයට අයත් ජනයා කුරුඳු තැලීම සම්බන්ධ ව කටයුතු කළ අතර ඔවුන් විසින් නිෂ්පාදනය කරන ලද කුරුඳු රජතුමා වෙත පිරිනමන ලදි. මෙම බ්‍රාහ්මණයන් පොළොන්නරුවේ රජකම් කළ පළමුවන විජයබාහු රජ සමයේ මෙරටට පැමිණි බවට ඇතැම් ග්‍රන්ථවල සඳහන් වේ. පෘතුගීසින් මෙරටට පැමිණෙන විට කෝට්ටේ රාජධානියේ පාලකයා වූ ධර්ම පරාක්‍රමබාහු රජතුමා වසරකට කුරුඳු බහර 400ක් (බහර 1 = කිලෝග්‍රෑම් 176.25) ඔවුනට දීමට එකඟ විය. ඒ වෙනුවට සිංහල රාජ්‍යයට මුහුදින් පැමිණිය හැකි සතුරු උපද්‍රවවලින් ආරක්ෂාව ලබා දීමට පෘතුගීසීන් එකඟ විය. මේ බව රන් සන්නසක් මාර්ගයෙන් රජතුමා විසින් පෘතුගීසි නියෝජිතයා වෙත ලබා දීමට කටයුතු කර ඇත. පෘතුගීසීන් ලංකාවේ මුහුදු බඩ පළාත් තම පාලනයට යටත් කර ගත් පසු කුරුඳු නිෂ්පාදනය විශාල වශයෙන් ඉහළ නැංවීමට ඔවුනට අවශ්‍ය විය. මේ සඳහා ඔවුන් විසින් සාම්ප්‍රදායික නිෂ්පාදන රටාව වෙනස් කරන ලදි. 1518 වර්ෂයේ ඔවුන් විසින් කොළඹ පෘතුගීසි බලකොටුවක් ඉදි කිරීමත් සමඟ මෙතෙක් මුස්ලිම්වරුන් සහ සිංහල රජතුමා අත පැවති කුරුඳු ඒකාධිකාරය ස්ථිර වශයෙන් ම බිඳ වැටීම ආරම්භ විය. එමගින් ඔවුන්ට කුරුඳු වෙළෙඳාමෙන් අධික ලාභයක් ඉපයීමට අවස්ථාව උදා විය. තමන්ගේ වෙළෙඳ ඒකාධිකාරය ආරක්ෂා කර ගැනීම සඳහා පෘතුගීසින් ඉතා කෲර ක්‍රියාවල නිරත වී ඇති අතර තව ද සිංහලයන් වහලුන් ලෙස සේවයේ යොදවා ගනිමින් අරාබි වෙළෙඳ නැව් ගිල්වා දමා ඇත.

ලන්දේසි ආගමනය

17 වන සියවසේ සිදු වූ ලන්දේසි ජාතිකයන්ගේ ආසියානු ආගමනයත් සමඟ පෘතුගීසි කුරුඳු වෙළෙඳ ඒකාධිකාරය බිඳ වැටීම ආරම්භ විය. පෘතුගීසි පලවා හැරීම සඳහා සිංහල රජතුමාගේ සහය ලබා ගත් ලන්දේසීහු 1658 වන විට පෘතුගීසින් මෙරටින් සම්පූර්ණයෙන් පන්නා දමා කුරුඳු නිෂ්පාදනයේ සහ වෙළෙඳාමේ අධිකාරිත්වය තමන් සතු කර ගත් හ. ඉඟුරු දී මිරිස් ගත්තා වාගේ යන ප්‍රසිද්ධ කියමන ජන වහරට එක් වීමට ද මෙම සිද්ධිය ඉවහල් වී ඇත.

සිය කුරුඳු නිෂ්පාදනය වැඩි කර ගැනීමේ අරමුණින් පෘතුගීසි මෙන් ම ලන්දේසීන් ද විවිධ සැහැසිකම්වල නිරත විය. ලංකාවේ පළමු වරට වනාන්තරයේ පවතින කුරුඳු ගස්වලින් අස්වනු නෙලා ගැනීමට පමණක් සීමා නො වී කුරුඳු වගාවක් ලෙස ආරම්භ කිරීමට පියවර ගත්තේ ලන්දේසීන් විසිනි. ඔවුන් විසින් වාර්ෂික ව කුරුඳු ටොන් 270ක් පමණ මෙරටින් අපනයනය කළ ද වාර්ෂික ව සීඝ්‍රයෙන් වැඩි වූ වෙළෙඳපොළ ඉල්ලුම හමුවේ තවදුරටත් වනාන්තරවලින් පමණක් ලබා ගත් කුරුඳු පමණක් යොදා ගනිමින් නිෂ්පාදනය කළ කුරුඳු ප්‍රමාණවත් නො වන තත්ත්වයට පත් විය. මේ ගැටලුව සඳහා විසඳුමක් ඉදිරිපත් කරන ලද්දේ ලොව ප්‍රථමයෙන් ම කොටස් වෙළෙඳපොළේ කොටස් නිකුතුවක් සිදු කළ මෙන් ම ලොව ප්‍රථම බහු ජාතික සමාගම ලෙස 1602 සිට 1798 දක්වා ම ක්‍රියාත්මක වූ ඕලන්ද පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගමේ සේවකයකු වූ ද කොක් (De Coke) විසිනි. ඔහු විසින් කුරුඳු වගාවක් ලෙස කිරීම පිළිබඳ අදහස පළමු වරට ඉදිරිපත් කළ අතර ඔහුගේ අදහසට අනුව පැළ සිටුවා වසර 8කින් අස්වනු නෙළා ගැනීම ආරම්භ කළ හැකි වේ. ඒ අනුව ලංකාවේ වැවිලි කර්මාන්තයට පදනම දමමින් ඔවුන් විසින් කොළඹ, කුරුඳුවත්ත, කදිරාන සහ ඇවරිවත්ත යන ස්ථානයන් හි පළමු කුරුඳු වතු ආරම්භ කරන ලදි. වසර 8කට පසු ව ලබා ගත හැකි වූ විශාල කුරුඳු නිෂ්පාදනයත් සමඟ යුරෝපීය වෙළෙඳපොළේ කුරුඳු මිල පහළ යෑමේ අවදානමක් ඇති වූ බැවින් තමන් සතු අතිරේක කුරුඳු තොග ගිනි තබා විනාශ කිරීමටත් වෙළෙඳ නැව් හිතාමතා ප්‍රමාද කිරීමටත් ලන්දේසීන් පෙළඹුණි. කුරුඳු නිෂ්පාදනයේ සම්පූර්ණ ඒකාධිකාරය ම තමන් අත තිබියදීත් ඔවුන් මෙ වැනි ක්‍රියාවක නිරත වී ඇත. ලන්දේසීන් විසින් සිය පාලන ව්‍යුහය කුරුඳු නිෂ්පාදනය වැඩි කර ගැනීමට හැකි වන අයුරින් පවත්වා ගෙන යන ලදි. ඒ අනුව, කපිතාන්වරයෙකු

යටතේ වෙන ම කුරුඳු දෙපාර්තමේන්තුවක් වූ බවත් එම කපිතාන් යටතේ කුරුඳු තලන්නන්ගේ විදානේවරුන් සිව්දෙනෙකුත් විදානේවරුන් යටතේ කුරුඳු තලන ගම්මුලාදෑනිවරුත් සේවය කර ඇත. කුරුඳු දෙපාර්තමේන්තුවේ කපිතාන් හෙවත් මහ බද්දෙගේ පාලනය යටතේ තිබූ කොස්ගොඩ, වැලිතර, මාදම්පේ, රත්ගම, දඩල්ල, මාගාල්ල සහ ලණුමෝදර කුරුඳු තලන්නන් විසූ ගම් විය. පැරණි සිරිත අනුව කුරුඳු තැලීමට බැඳී සිටි පන්නියා නම් කුලය විසූ වලල්ලාවිටි කෝරලේ ගම් එකක් හෝ දෙකක් ද මොහු යටතේ විය. මේ අනුව කුරුඳු නිෂ්පාදනය මනා සංවිධානයකින් පවත්වා ගැනීම සඳහා ලන්දේසීන් විසින් ගම් මට්ටම දක්වා විහිදුනු පාලන ව්‍යුහයක් පවත්වා ගෙන ගිය බව පැහැදිලි වෙයි. 1766 පෙබරවාරි මස 14 වන දින එවකට උඩරට පාලනය කළ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා සහ ලන්දේසීන් අතර ඇති වූ හඟුරන්කෙත ගිවිසුම නමින් ප්‍රකට ගිවිසුම අනුව ද ලංකාවේ සශ්‍රීක ලෙස කුරුඳු වගා කෙරුණු බව පැහැදිලි වෙයි.

ඉංග්‍රීසීන්ගේ ආගමනය

වර්ෂ 1796 දී ලන්දේසීන් පරදවා ඉංග්‍රීසීන් විසින් ලංකාවේ මුහුදු බඩ පෙදෙස් අත්පත් කර ගැනීමත් සමඟ ලන්දේසීන් සතු ව පැවති කුරුඳු ඒකාධිකාරය සම්පූර්ණයෙන් ම බිඳ වැටුණි. එයින් වසර 2කට පසු ව එනම් වර්ෂ 1798 දී ඕලන්ද පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම අක්‍රීය වූ අතර 1800 දී පාඩු ලැබීම හේතුවෙන් සම්පූර්ණයෙන් ම වසා දැමුණි. මෙසේ කුරුඳු නිෂ්පාදනය තමන් අතට පත් වීමත් සමඟ ඇමරිකානු යටත් විජිත අහිමි වීමෙන් ඉංග්‍රිසින්ට සිදු ව තිබූ පාඩුව සමනය කර ගැනීමට ඔවුහු සමත් වූ හ. 19 වන සියවස මැද භාගය වන විට කුරුඳු නිෂ්පාදනය ටොන් 1000ක් පමණ දක්වා වැඩි කර ගැනීමට ඉංග්‍රීසීන් සමත් විය. එසේ ම මධ්‍යතන යුගයට වඩා යුරෝපීය වෙළෙඳපොළ වඩා පුළුල් ව හා ප්‍රජාතාන්ත්‍රික ව පැවති 19 වන සියවස ආරම්භයේ දී කුරුඳුවලට වාසිදායක මිලක් තිබිණි. මේ හේතුවෙන් කුරුඳු නිෂ්පාදනයට අලුතෙන් රටවල් එක් වන්නට විය. එසේ වුව ද 19 වන සියවස මුල පටන් ජාවා, සුමාත්‍රා, මුරුසිය හා ගයනා වැනි රටවල ද කුරුඳු වගාව ආරම්භ කිරීම හේතුවෙන් සැපයුම ඉහළ ගිය අතර මිල පහළ යෑමට හේතුවක් විය. කුරුඳු නිෂ්පාදනවල මිල ඉහළ මට්ටමක පැවති අවදියේ දී මිලෙන් අඩු කැෂියා කෙරෙහි පාරිභෝගික අවධානය යොමු වූ අතර යුරෝපීය පාරිභෝගිකයන්

මෙම මිල අඩු ආදේශකයට හුරු විය. මෙම තත්ත්වය යටතේ අයහපත් කිරීමට හේතුවෙන් ආරම්භයේ සිට ම රාජ්‍ය ඒකාධිකාරයක් ව පැවති කුරුඳු නිෂ්පාදනය 1833 සිට බ්‍රිතාන්‍යයන් විසින් අත්හැර දමන ලදි. කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ යෝජනා අනුව කුරුඳු වතු පෞද්ගලික අංශයට විකුණා දැමීම මෙහි ප්‍රතිඵලයක් විය. 1835 දී කුරුඳු රාත්තලක් සිලිං 9 පැන්ස 9ක් වූ අතර 1848 මෙය සිලිං 3 පැන්ස 6ක් දක්වා අඩු විය. ශ්‍රී ලංකාව හා තරගකාරී වූ අනෙකුත් කුරුඳු නිෂ්පාදනය කරන රටවල් හා සැසඳීමේ දී මෙරට වැටුප් හා තීරු බදු පහළ මට්ටමක පැවතුණි. එවකට තීරු බද්ද රාත්තලකට සිලිං 3ක් වශයෙන් පැවතුණි. එහෙත් පසු ව වැවිලිකරුවන්ගේ උද්ඝෝෂණ හේතුවෙන් 1841 දී එම බද්ද සිලිං 2 දක්වා අඩු කළේය. එහෙත් ඉන් පලක් නොවූ අතර 1853 වන විට තීරු බද්ද සම්පූර්ණයෙන් ම ඉවත් කරන ලදි. 1840 දශකය අග භාගයේ බ්‍රිතාන්‍යය ඇතුළු යුරෝපීයයන්ට බලපෑ ආර්ථික අර්බුදය කුරුඳු කර්මාන්තය තවදුරටත් පිරිහීමට බලපෑ අතර කුරුඳු කර්මාන්තයට ඇති වූ පරිහානියෙන් ගොඩ ඒමට තවදුරටත් නොහැකි තත්ත්වයට පත් විය. 1830 වර්ෂයේ දී කුරුඳු රාත්තල් ලක්ෂ 5ක් අපනයනය කර පවුම් ලක්ෂයක ආදායමක් ලෙස උපයා ගත්ත ද 1890 වන විට කුරුඳු රාත්තල් ලක්ෂ 20ක් අපනයනය කර ආදායම ලබා ගෙන තිබුණේ පවුම් 91,000ක් පමණි.

ශ්‍රී ලංකාව සතු ව පැවති කුරුඳු ඒකාධිකාරයන් බිඳ වැටීම

මෙසේ ලංකාව සතු ව පැවතුණු කුරුඳු ඒකාධිකාරය බිඳ වැටීම මෙයින් ආරම්භ විය. කුරුඳු පමණක් නො ව අනෙකුත් කුළුබඩු බෝග සඳහා ද මෙම අයහපත් තත්ත්වය බලපෑ අතර කෝපි, තේ, කොකෝවා වැනි නව බෝග නිසා එතෙක් කුරුඳු ඇතුළු කුළුබඩු සතු ව පැවති කිරුළ අහිමි විය. 1850 වසරේ ලංකාවේ මුළු කුරුඳු වගා බිම් ප්‍රමාණය අක්කර 50,000ක්

පමණ වී ඇත. 1928 වන විට මෙම කුරුඳු ඉඩම් වැඩි ප්‍රමාණයක් පොල් වගාව සඳහා යෙදවීම හේතුවෙන් මුළු කුරුඳු ඉඩම් ප්‍රමාණය අක්කර 25,000ක් පමණ දක්වා අඩු වී ඇත. එයින් අක්කර 14538ක් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවල ද අක්කර 8,000ක් පමණ මීගමුව ප්‍රදේශයේ ද විය.

දකුණු ලක කුරුඳු ව්‍යාපාරය

කෘෂිකර්මාන්තය සඳහා දකුණු පළාතේ දායකත්වය

ශ්‍රී ලංකාවේ ජාතික ආදායමට දකුණු පළාතෙන් ලැබෙන දායකත්වය ඉතා ඉහළ අගයක් ගනී. කෘෂිකාර්මික හා සංචාරක ක්ෂේත්‍ර වලට දකුණු පළාතෙන් වර්තමානයේ දී ඉතා ඉහළ දායකත්වයක් ලබා දෙන අතර හම්බන්තොට වරාය, මත්තල ගුවන්තොටුපොළ ආදී අතිවිශාල ව්‍යාපෘති හේතුවෙන් නුදුරු අනාගතයේ දී කාර්මික ක්ෂේත්‍රයේ සංවර්ධනයක් ද දැක ගත හැකි වනු ඇත. එමෙන් ම කොග්ගල නිදහස් වෙළෙඳ කලාපය යනාදී නිදහස් වෙළෙඳ කලාප නිසා කාර්මික ක්ෂේත්‍රයට දකුණු පළාතෙන් දැනටමත් සැලකිය යුතු දායකත්වයක් ලැබේ. කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ වී, රබර්, පොල් සහ කුරුඳු වැනි බෝග ප්‍රධාන තැනක් ගනී. තව ද, ධීවර කර්මාන්තය සඳහා ද ඉහළ දායකත්වයක් දකුණු පළාතෙන් නො මඳ ව ලැබේ. ඊට අමතර ව ශ්‍රී ලංකාවේ හික්කඩුව, උණවටුන, මිරිස්ස, තංගල්ල, බෙන්තොට සහ කොග්ගල වැනි සංචාරක වෙරළ තීරයන් දකුණු පළාතට හිමිකම් පාන බැවින් සංචාරක ආකර්ෂණය ඉතා ඉහළ පළාත බවට එය ඉතිහාසය තුළ ලියවී ඇත. එමෙන් ම පාරම්පරික නිෂ්පාදන වන බීරළු රේන්ද නිර්මාණ, කැටයම් කලාව, වෙස් මුහුණු කලාව දකුණු පළාත කල එළි කරයි. දකුණු පළාත ප්‍රධාන වශයෙන් දිස්ත්‍රික්ක තුනකින් සමන්විත වේ. ඒ ගාල්ල දිස්ත්‍රික්කය, මාතර දිස්ත්‍රික්කය සහ හම්බන්තොට දිස්ත්‍රික්කය වශයෙනි. ගාල්ල දිස්ත්‍රික්කයේ මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝ මීටර 1,652ක් වන අතර මාතර දිස්ත්‍රික්කය වර්ග කිලෝ මීටර 1,283ක් සහ හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා වර්ග කිලෝ මීටර 2,609ක් වේ. ඒ අනුව දකුණු පළාත වර්ග කිලෝ මීටර 5,544කින් යුක්ත වන අතර එය ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් 8.4%ක් වේ. කෘෂිකර්ම අමාත්‍යාංශ මූලාශ්‍රවලට අනුව ශ්‍රී ලංකාවේ පිහිටි කෘෂිකර්ම කලාප 46 අතුරින් 19ක් ම දකුණු පළාතේ පිහිටා ඇත. එය 41.3%ක් තරම් ඉහළ දායකත්වයක් වේ. දකුණු පළාතේ කෘෂිකර්ම කලාප වැඩි වශයෙන් පිහිටා ඇත්තේ මාතර කලාප 8ක් සහ හම්බන්තොට කලාප 7ක් වශයෙනි. දකුණු පළාත සතු මුළු භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 75,472ක් අස්වද්දන ලද කුඹුරු වන අතර එහි ප්‍රතිශතය 13.4%කි. පිළිවෙළින් තේ 10.0%, රබර් 1.9%, පොල් 7.8%, කුරුඳු 3.6% වශයෙන් කෘෂිකාර්මික භෝග තුළ ඉඩම් පරිහරණ රටාවක් දැක ගත හැකිවේ.

දකුණු පළාත තුළ කුරුඳු වගාවේ ව්‍යාප්තිය

2016 සංඛ්‍යා ලේඛනවලට අනුව, දකුණු පළාතේ කුරුඳු වගා කර ඇති බිම් ප්‍රමාණය හෙක්ටයාර් 21,688ක් වේ. මෙයින් ඵල දරන බිම් ප්‍රමාණය හෙක්ටයාර් 20,095ක් වන අතර ඵල නොදරන බිම් ප්‍රමාණය හෙක්ටයාර් 1,592ක් පමණි. වැඩි ම දායකත්වය කුරුඳු සඳහා ලබා දෙනු ලබන්නේ ගාල්ල දිස්ත්‍රික්කයෙනි. එය හෙක්ටයාර් 12,093ක් වන අතර දකුණු පළාතේ කුරුඳු වගා කරන මුළු බිම් ප්‍රමාණයෙන් 55.8%ක් වේ. දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ හෙක්ටයාර් 6,677ක කුරුඳු වගාවක් ඇති අතර එය දකුණු පළාතේ කුරුඳු වගා කරන මුළු බිම් ප්‍රමාණයෙන් 30.8%ක් පමණ වේ. හම්බන්තොට දිස්ත්‍රික්කය කුරුඳු වගාව සඳහා දකුණු පළාතට අවම දායකත්වයක් ලබා දෙනු ලබන අතර, එය හෙක්ටයාර් 2,918ක් වේ. එහි ප්‍රතිශතය 13.4%ක් වේ. ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතුරින් කරන්දෙනියේ හෙක්ටයාර් 3,934ක ද බලපිටියේ හෙක්ටයාර් 1,491ක ද අම්බලන්ගොඩ හෙක්ටයාර් 1,563ක ද කුරුඳු වගා කෙරේ. එය වගා කෙරෙන මුළු ඉඩම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් වශයෙන් පිළිවෙළින් 34.9%, 13.2%, 13.9%ක් වේ. ඒ අනුව වගා කෙරෙන මුළු ඉඩම් ප්‍රමාණයෙන් 62%ක දායකත්වය දරනු ලබන්නේ ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 3කිනි. මාතර දිස්ත්‍රික්කයේ

වැඩි ම දායකත්වය මුලටියන හෙක්ටයාර් 976 ක් ද අකුරැස්ස හෙක්ටයාර් 546ක් ද කඹුරුපිටිය හෙක්ටයාර් 759 ක් ද යනාදී වශයෙනි. මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුන මාතර දිස්ත්‍රික්කයේ කුරුඳු ඵල දරන බිම් ප්‍රමාණයෙන් 38.6%ක් සඳහා දායකත්වයක් සපයනු ලබයි. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඵල දරණ කුරුඳු බිම් ප්‍රමාණය වලස්මුල්ලේ හෙක්ටයාර් 1,541 ක් ද කටුවන හෙක්ටයාර් 875 ක් ද ක් වන අතර හම්බන්තොට දිස්ත්‍රික්කයේ කුරුඳු නිෂ්පාදන භූමි ප්‍රමාණය 82.8%කි. 2016 වසර සඳහා ගාල්ල දිස්ත්‍රික්කයේ මුළු කුරුඳු අස්වැන්න කිලෝ ග්‍රෑම් 8,620,829ක් වන අතර කරන්දෙනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිලෝ ග්‍රෑම් 1,944,000 ක් ද බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිලෝ ග්‍රෑම් 1,035,000 ක් ද අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිලෝ ග්‍රෑම් 1,737,675ක් ද වේ. එය ගාල්ල දිස්ත්‍රික්කයේ මුළු කුරුඳු අස්වැන්නෙන් 54.7%ක් පමණ වේ. 2016 වසරේ මාතර දිස්ත්‍රික්කයේ කුරුඳු අස්වැන්න කිලෝ ග්‍රෑම් 8,360,357 ක් වූ අතර ඉන් කිලෝ ග්‍රෑම් 2,711,500 ක් පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද කිලෝ ග්‍රෑම් 2,169,000ක් මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද ලැබුණි. එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකෙහි දායකත්වය 58.4%ක් වේ. කිලෝ ග්‍රෑම් 2,140,525ක් වූ හම්බන්තොට දිස්ත්‍රික්කයේ අස්වැන්නෙන් කිලෝ ග්‍රෑම් 1,142,700ක් වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ලැබුණු අතර කිලෝ ග්‍රෑම් 649,200ක් තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ලැබුණි. එය 83.7% ක් තරම් ඉහළ දායකත්වයකි.

(මූලාශ්‍රය : සංඛ්‍යාන නිබන්ධනය 2016)

කුරුඳු භෝගයේ වැදගත්කම

කුරුඳු ශාකය සදාහරිත බහුවාර්ෂික බෝගයක් සේ සැලකේ. එය ශ්‍රී ලංකාවට ආවේණික බෝගයක් වන අතර, එය "සිනමෝමම් වේරම්" (Cinnamomum Verum Presl) විශේෂ ලොරේසියේ කුලයට සහ සිනමෝනම් ගණයට අයත්වේ. ශ්‍රී ලංකාවේ වාණිජ මට්ටමෙන් වගා කරන කුරුඳුවලින් ප්‍රමුඛතාවයේ ලා සැලකෙන්නේ "සිනමෝමම් වේරම්" යන වර්ගය වේ. කුරුඳු සඳහා ම ආවේණික වූ නැවුම් සුවඳ, කුරුඳු නිෂ්පාදනයේ ගුණාත්මක බව තීරණය කරන සාධකයකි. එහි වර්ණය ලා දුඹුරු පැහැයේ සිට වද රතු පැහැය දක්වා විහිදී පවතී. ශ්‍රී ලංකාවේ කුරුඳු ලෝක වෙළෙඳපොළ දක්වා ගෙන යාමට සැබෑ කුරුඳු රසය ඉවහල් වී ඇත. ගුණාත්මක බව තීරණය කරන අනෙකුත් සාධක වන්නේ කුරුඳු කූරු සඳහා 14%කට නො වැඩි සහ අනෙකුත් කුරුඳු නිෂ්පාදන සඳහා 12% කට නො වැඩි තෙතමනයක් සහ කුරුඳු කූරු සඳහා වියලි බරෙන් 1% ක් සහ අනෙකුත් කුරුඳු නිෂ්පාදනවල 0.7%ක වාෂ්පශීලී තෙල් ප්‍රතිශතයක් පැවතීම, ඇසුරුම් කාලය මාස 12ක් නො ඉක්මවීම සහ ඇසුරුම් කිරීමේ දී පිරිසිදු වියලි ඝන රෙදි, කඩදාසි හෝ පොලිතීන් භාවිත කිරීම යනාදිය වේ. ප්‍රධාන කුරුඳු නිෂ්පාදන ලෙස සැලකෙන්නේ කුරුඳු පොතු කූරු, කූරු කැබලි, පොතු කැබලි සහ කුරුඳු කොළ/පොතු/මුල් යනාදිය භාවිතකර ලබා ගත් කුරුඳු තෙල් වේ. විශේෂයෙන් ම ශ්‍රී ලංකාවේ ගෘහාශ්‍රිත ආහාර පිසීමේ දී කුළු බඩුවක් ලෙස කුරුඳු භාවිතයට ගනී. එසේ ම කේක්, පැණිරස කෑම යනාදිය සෑදීමේ දී රසකාරකයක් ලෙස ද කුරුඳු භාවිත කරනු ලබයි. එසේ ම දන්ත රෝගී තත්ත්වයන් සමනය කිරීම සඳහා සාම්ප්‍රදායික බෙහෙතක් ලෙස ද කුරුඳු තෙල් භාවිතය සිදු වේ. ඒ අනුව දන්ත ඖෂධ සඳහා ද කුරුඳු භාවිත කරනු ලබයි. කුරුඳු ඉතාමත් සෞඛ්‍ය සම්පන්න විෂබීජ නාශකයක් වනවා මෙන් ම කුරුඳු කුඩු පානයක් ලෙස ගැනීම ද සෞඛ්‍යයට හිතකර වේ. ඒ අනුව වර්තමානයේ ලෝකයේ වෙළෙඳපොළවල කුරුඳු තේ (Cinnamon Tea) පාරිභෝගිකයන් අතර ඉතා ජනප්‍රිය තේ වර්ගයකි. කුරුඳු තේ ශ්‍රී ලාංකික ජනතාව අතර ද ජනප්‍රිය පානයක් වී ඇත. කුරුඳුවල ඇති ගුණාත්මක තත්ත්වය පදනම් කර ගෙන විවිධ රෝග සඳහා ඖෂධ පෙති වශයෙන් ද භාවිත වේ. විශේෂයෙන් කොලෙස්ටරෝල් අඩු කිරීම මෙමගින් සිදු වන බවට ද විශ්වාසයක් පවතී. තව ද කුරුඳුවල ඇති ප්‍රසන්න සුවඳ හේතුවෙන් සුවඳ විලවුන් නිපදවීමේ දී

ඉතා අධික ලෙස කුරුඳු භාවිතය සිදු වේ. කෙසේ වුව ද ලෝක වෙළෙඳපොළෙහි කුරුඳු අලෙවියෙන් 85%ක් ම කැෂියා කුරුඳු වන අතර ඉතිරි 15% සත්‍ය කුරුඳුවලට හිමි වේ. සත්‍ය කුරුඳු අලෙවියෙන් 90%ක ප්‍රමාණයකට ම ශ්‍රී ලංකාව දායක වේ.

ශ්‍රී ලංකාවේ වාර්ෂික කුරුඳු නිෂ්පාදනය, අපනයන ප්‍රමාණ හා වටිනාකම්

කුරුඳු අපනයන ප්‍රමාණය සහ වටිනාකම පිළිබඳ ව දිස්ත්‍රික් වශයෙන් වෙන් වූ දත්ත මූලයක් නොමැති වීම අඩුපාඩුවකි. ඒ අනුව, ශ්‍රී ලංකාවේ වාර්ෂික කුරුඳු නිෂ්පාදනය, අපනයන ප්‍රමාණය සහ වටිනාකම් පිළිබඳ විස්තර පහත වගුවේ දැක්වේ.

අපනයන සංවර්ධන මණ්ඩලයේ තොරතුරුවලට අනුව 2016 ඇමරිකානු ඩොලර් මිලියන 159.07ක් වූ කුරුඳු අපනයනය ලෝකයේ කුරුඳු අපනයන ප්‍රතිශතයක් ලෙස 32.9%ක අගයක් ගනු ලැබී ය. එසේ ම එය ලෝකයේ කුරුඳු අපනයන ශ්‍රේණිගත කිරීම් අනුව අංක 1හි ලා සැලකේ. මෙම කුරුඳු අපනයනය වටිනාකම ශ්‍රී ලංකාවේ මුළු අපනයන වටිනාකමෙන් 1.42% කි. මෙම කුරුඳු අපනයනයෙන් 80%ක් ම ලෝකයේ ප්‍රධාන වෙළෙඳපොළවල් සඳහා අපනයනය කරනු ලබයි. ශ්‍රී ලංකාවෙන් කුරුඳු ආනයනය කරන ප්‍රධාන රටවල් වනුයේ මෙක්සිකෝව, ඇමරිකා එක්සත් ජනපදය, පේරු, කොලොම්බියාව, ඉක්වදෝරය සහ බෙල්ජියම වේ. මෙක්සිකෝ ජාතීන් (පෘතුගීසීන්) කුරුඳු මුලින් ම සොයා ගැනීමත්, එකල සිට භාවිතයට ගැනීමත්, ඔවුන්ගේ සියලු ම කෑම බීම සඳහා කුරුඳු එකතු කර ගැනීමත් පුරුද්දක් වී ඇත. ඔවුන් කුරුඳු කෙරෙහි වැඩි ඉල්ලුමක් දැක්වීමට එය හේතු වී ඇත.

2016 වර්ෂයේ දී ශ්‍රී ලංකාවෙන් මෙක්සිකෝවට ඇමරිකානු ඩොලර් මිලියන 69.3ක වටිනාකමකින් යුතු කුරුඳු අපනයනය කර ඇති අතර, එය ශ්‍රී ලංකාවෙන් මෙක්සිකෝවට යවනු ලබන අපනයන එකතුවෙන් 52.43% ක් තරම් ඉහළ අගයක් ගනී. කෙසේ වුව ද පසුගිය වසර කිහිපය සළකා බැලීමේ දී 2012 වර්ෂයේ දී 67.5% ක් වූ මෙම ප්‍රතිශතය ක්‍රමක්‍රමයෙන් 52.43%ක් දක්වා පහත වැටී ඇත. එහෙත් මෙක්සිකෝව සඳහා අපනයන වටිනාකම සාමාන්‍ය තත්ත්වයේ පවතී. ශ්‍රී ලංකාවේ සමස්ත කුරුඳු අපනයනයෙන් 43.57%ක් තරම් විශාල ප්‍රමාණයක් 2016 දී මෙක්සිකෝව විසින් මිලදී ගෙන ඇත. දෙවනුව කුරුඳු අපනයනයෙන් වැඩි ම ප්‍රමාණයක් මිලදී ගනු ලැබුවේ ඇමරිකා එක්සත් ජනපදයයි. එය ප්‍රතිශතයක් වශයෙන් කුරුඳු අපනයනයෙන් 18.7%ක් වන අතර වටිනාකම එක්සත් ජනපද ඩොලර් මිලියන 24.97ක් වේ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2017 වාර්ෂික වාර්තාවේ දැක්වෙන පරිදි කුරුඳු, කරාබුනැටි සහ ගම්මිරිස් අපනයනවල ඉහළ ක්‍රියාකාරිත්වය හේතුවෙන් කුළුබඩු අපනයන ආදායම එක්සත් ජනපද ඩොලර් මිලියන 406 කින් එනම් 28%කින් කැපී පෙනෙන වර්ධනයක් පෙන්වා ඇත. තව ද, 2017 වර්ෂයේ දී අපනයන පරිමා ඉහළ යෑම සහ සාමාන්‍ය මිල ගණන් ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් කුරුඳු අපනයන ආදායම 27.4% කින් වර්ධනය විය.

වගුව 1 : වාර්ෂික කුරුඳු නිෂ්පාදනය, අපනයන ප්‍රමාණය සහ වටිනාකම

වර්ෂය	නිෂ්පාදනය (මෙ.ටො.)	අපනයන ප්‍රමාණ (මෙ.ටො.)	වටිනාකම් (එ.ජ.ඩො. මිලියන)
2011	18,250	13,747	121.18
2012	17,165	14,762	129.53
2013	17,500	14,148	132.39
2014	17,600	13,949	132.28
2015	17,707	13,828	131.18
2016	18,945	14,946	159.07

මූලය: ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික දත්ත 2017, ශ්‍රී ලංකා මහ බැංකුව

කුරුඳු නිෂ්පාදනය

කුරුඳු පොතු ගලවා කුරුඳු කූරු ලෙස සකසා වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකාවට ආවේණික ක්‍රමවේදයක් වේ. මෙසේ කුරුඳු නිෂ්පාදනය ශ්‍රී ලංකාවේ කුරුඳුවල අනන්‍යතාව ආරක්ෂා කිරීමට

වගුව 2: අපනයන සංයුතිය

කාණ්ඩය	2016		2017 (අ)		වටිනාකමේ වෙනස එ.ජ. ඩොලර් මිලියන	වාර්ෂික වෙනස්වීම %	වෙනස් වීමට වූ දායකත්වය %
	වටිනාකම එ.ජ. ඩොලර් මිලියන	දායකත්වය %	වටිනාකම එ.ජ. ඩොලර් මිලියන	දායකත්වය %			
කෘෂිකාර්මික අපනයන	**2,326.1**	**22.6**	**2,767.2**	**24.4**	**441.1**	**19.0**	**42.0**
තේ	1,269.0	12.3	1,529.8	13.5	260.8	20.5	24.8
රබර්	32.7	0.3	38.9	0.3	6.3	19.1	0.6
පොල්	366.0	3.5	347.9	3.1	-18.1	-4.9	-1.7
කුළුබඩු	317.1	3.1	406.2	3.6	89.2	28.1	8.5
එළවළු	26.5	0.3	28.5	0.3	2.0	7.5	0.2
සකස් නො කළ දුම්කොළ	31.2	0.3	36.5	0.3	5.3	17.1	0.5
සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත	114.1	1.1	138.7	1.2	24.6	21.6	2.3
මුහුදු ආහාර	169.6	1.6	240.6	2.1	71.0	41.9	6.8
කාර්මික අපනයන	**7,940.1**	**77.0**	**8,541.9**	**75.2**	**601.8**	**7.6**	**57.3**
රෙදිපිළි හා ඇගලුම්	4,884.1	47.4	5,031.9	44.3	147.9	3.0	14.1
රබර් නිෂ්පාදිත	767.9	7.4	835.4	7.4	67.5	8.8	6.4
ඛනිජ තෙල් නිෂ්පාදිත	286.9	2.8	434.3	3.8	147.5	51.4	14.0
මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ	273.9	2.7	257.5	2.3	-16.4	-6.0	-1.6
ආහාර, පාන වර්ග හා දුම්කොළ	323.7	3.1	392.7	3.5	69.0	21.3	6.6
යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ	317.6	3.1	370.8	3.3	53.2	16.7	5.1
මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත	42.4	0.4	48.8	0.4	6.5	15.3	0.6
ප්‍රවාහන උපකරණ	131.5	1.3	162.3	1.4	30.8	23.4	2.9
සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන්	165.6	1.6	158.4	1.4	-7.2	-4.4	-0.7
පිගන් මැටි නිෂ්පාදිත	34.4	0.3	33.7	0.3	-0.7	-1.9	-0.1
අනෙකුත් කාර්මික අපනයන	712.2	6.9	816.1	7.2	103.8	14.6	9.9
ඛනිජමය අපනයන	**29.0**	**0.3**	**34.5**	**0.3**	**5.5**	**19.0**	**0.5**
වර්ග නො කළ අපනයන	**14.5**	**0.1**	**16.9**	**0.1**	**2.3**	**16.0**	**0.2**
මුළු අපනයන (ආ) (ඇ)	**10,309.7**	**100.0**	**11,360.4**	**100.0**	**1,050.7**	**10.2**	**100.0**
වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතය (ඈ)	**145.60**		**152.46**				

(අ) තාවකාලික
(ආ) ප්‍රති අපනයන ඇතුළත් නො වේ.
(ඇ) ගළපන ලද
(ඈ) විනිමය අනුපාතය: එ.ජ. ඩොලරයට රුපියල්

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා වෙනත් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයනකරුවන්
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

උපුටා ගැනීම: ශ්‍රී ලංකා මහ බැංකුව - වාර්ෂික වාර්තාව 2017

හේතුවක් වී ඇත. ස්වාභාවික තත්ත්වයන් යටතේ කුරුඳු ගස මීටර 10 - 15 දක්වා උසකට වැඩෙන අතර, කඳෙහි වට ප්‍රමාණය සෙන්ටි මීටර 60 - 75 දක්වා වර්ධනය වේ. සාමාන්‍යයෙන් වියළි දේශගුණික කලාප කුරුඳු වගාවට යෝග්‍ය නො වේ. විශේෂයෙන් පහතරට අති රතු දුඹුරු ලැටපොලික් සහ අපරිණිත දුඹුරු ලෝම පස කුරුඳු වගාවට යෝග්‍ය පසකි. එ සේ ම රතු සහ පොඩ්සොලික පස ද කුරුඳු වගාවට යෝග්‍ය වේ. වඩාත් උචිත උෂ්ණත්ව පරාසය වනුයේ සෙල්සියස් අංශක 250-300 දක්වා වේ. එමෙන් ම වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර 1,875 සිට 3,750 දක්වා පරාසය කුරුඳු වගාව සඳහා සුදුසු වේ.

කුරුඳු පොත්තේ, කොළයේ සහ නටුවේ රස සහ සැර ගතිය අනුව "සාම්ප්‍රදායික කුරුඳු දර්ශ" 5කි. ඒවා නම් පැණි මිරිස් කුරුඳු, පැණි රස කුරුඳු, සෙවල කුරුඳු, කහට කුරුඳු සහ තිත්ත කුරුඳු වශයෙනි. නමුත් වාණිජ මට්ටමෙන් සිදු කරනු ලබන වගාවන් සඳහා වඩාත් සුදුසු පැණි මිරිස් කුරුඳු සහ පැණි රස කුරුඳු යන දර්ශ දෙක ය. තව ද, කුරුඳු පත්‍රයේ හැඩය අනුව හඳුනා ගත් සත්‍ය කුරුඳු වර්ග 7ක් වෙයි. ඒවා නම් සාමාන්‍ය කුරුඳු පත්‍ර හැඩය, විශාල පත්‍ර හැඩය, කුඩා රවුම් පත්‍ර හැඩය, විශාල රවුම් පත්‍ර හැඩය, සාමාන්‍ය පත්‍ර ඇතුළට වක්‍ර, කෙටි සිහින් පත්‍ර හැඩය සහ දිග සිහින් පත්‍ර යනුවෙනි.

ගුණාත්මක සහ ඉහළ අස්වැන්නකින් යුත් කුරුඳු වරණ හඳුනා ගැනීම සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විවිධ පර්යේෂණ සිදු කරනු ලබයි. ඒ අනුව, ශ්‍රී ගැමුණු සහ ශ්‍රී විජය යන වරණ දැක ගත හැකි ය.

කුරුඳු සැකසීම

කුරුඳු සැකසීම මනා දැනුමකින් පළපුරුද්දකින් කළ යුතු කටයුත්තක් වේ. කුරුඳු වගාකරුවන්

වගුව 3: වැඩි දියුණු කරන ලද ශ්‍රී ගැමුණු හා ශ්‍රී විජය වරණ දෙකෙහි විශේෂ ලක්ෂණ

විස්තරය	ශ්‍රී ගැමුණු	ශ්‍රී විජය
පොතු අස්වැන්න (කිලෝ ග්‍රෑම්/හෙක්ටයාර)	1200 - 1300	1600 - 1800
පොතු තෙල් %	3.2 - 3.6	1.4 - 1.6
කොළ තෙල් %	3.6 - 3.9	2.9 - 3.1
පොත්තෙහි අඩංගු සිනමැල්ඩි %	80.0 - 83.0	50.0 - 55.0
කොළවල අඩංගු ඉයුජිනෝල් %	88.0 - 92.7	90.0 - 94.0

(මූලාශ්‍රය - තාක්ෂණික ප්‍රකාශනය 5 - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව)

බොහොමයක් සිටිය ද කුරුඳු සැකසීම සඳහා දැනුමක් සහ පළපුරුද්දක් සහිත පුද්ගලයන් සිටිනුයේ ඉතා අතලොස්සක් පමණි. එබැවින් කුරුඳු සකස් කිරීම සඳහා අධික වියදමක් දැරීමට කුරුඳු නිෂ්පාදකයාට සිදු වේ. සාමාන්‍යයෙන් කුරුඳු සැකසීමට ගන්නා උපකරණ වනුයේ කපන කැත්ත, තලන කොකැත්ත, පිත්තල දණ්ඩ, කතුර, ඇඟිලි කොපුව, (පෙති කෝටුව) මිනුම් දණ්ඩ සහ සූරන කොකැත්ත වේ.

කුරුඳු සැකසීමට ගන්නා උපකරණ

කුරුඳු සැකසීමේ දී මූලික ව කුරුට්ට සීරීම සිදු කළ යුතු වේ. අනතුරු ව පිත්තල දණ්ඩෙන් මැදීම සිදු කර ගත යුතු ය. පිත්තල දණ්ඩෙන් මැදීම ඉතා වෙහෙසකර ක්‍රියාවක් වන අතර, විශේෂයෙන් ම කුරුඳු තැලීම අපහසු කාලයන්හි දී එනම් කුරුඳු ගසේ අලුතෙන් දළු හෝ මල් ඇති කාලයේ දී එය වඩාත් වෙහෙසකර ය. දිගු වියලි කාලවලදීත් පිත්තල දණ්ඩෙන් මැද පොතු බුරුල් කර ගැනීම සඳහා වැඩි ආයාසයක් දැරීමට සිදු වේ. සමහරවිට සති කිහිපයකට කුරුඳු තැලීම අත්හිටුවීමට සිදු වේ. පොත්ත කැපීමට සුදුසු මට්ටමට මැද ගත් පසු පොත්ත කැපීම සිදු කළ හැකි ය. කපා ගත් පොත්ත කඳින් වෙන් කර ගලවා ගැනීමෙන් අනතුරු ව සන්ධි කිරීම සහ කුරු පිරවීම සිදු කළ හැකි ය. අවසාන වශයෙන් කපා ගත් කුරු සැකසීම (බඩ ඇඹරීම සිදු කළ හැකි ය.)

(මූලාශ්‍රය - තාක්ෂණික ප්‍රකාශනය 5 - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව)

කුරුඳු නිෂ්පාදනය සඳහා අර්ථ දැක්වීම

අන්තර් ජාතික ප්‍රමිතීන් හඳුනා ගැනීම සඳහා පහත සඳහන් අර්ථ දැක්වීම් භාවිත කර ඇත.

1. කුරුඳු කුර (සම්පූර්ණ කුරු)

හොඳින් මෝරන ලද කුරුඳු වගාවකින් ලබා ගත් කඳන්වල පිටත සුඹුළ සූරා ගලවා වෙන් කර ගත් ඇතුළත පොත්ත එක මත එක තබා සන්ධි කරගත් කුරු ය. මේවායේ ඇතුළත කුහරය එම කුරුඳු වර්ගයේ ම කුඩා කැබලි වලින් පුරවා පවනේ වේලා ගෙන තිබිය යුතු ය. කුරක දිග සෙන්ටි මීටර 105 (+/- 5) විය යුතු වේ. කුරුඳු කුරු පසු ව ශ්‍රේණිවලට වෙන් කරනු ලැබේ.

2. කැපූ කුරුඳු කුරු

නියමිත දිගකට කපා කෙටි කර ගත් කුරුඳු කුරු වේ. සම්පූර්ණ කුරුඳු කුරු ලෙසට ම ශ්‍රේණි කරනු ලැබේ.

3. කුරුඳු කුරු කැබලි (සම්පූර්ණ කුරුවල කැඩුණු කොටස)

සම්පූර්ණ කුරුඳු කුරුවලින් කැඩුණු විවිධ විශාලත්වයෙන් යුතු දිග මිලි මීටර 200ට අඩු කොටස් හා පතුරු මේ යටතට ගැනේ. මෙහි 5%ක් දක්වා බර අනුව ෆෙදරින් සහ පොතු කැබලි අඩංගු විය හැකි ය. වෙනත් බාහිර ද්‍රව්‍ය 2%කට වඩා අඩංගු නො විය යුතු ය.

4. ෆෙදරින්ස්

කුරුඳු කුරු සකස් කිරීමේ දී කුරුඳු පොත්තෙන් කැඩී යන කුඩා කොටස් ය. මෙහි 10%ක් දක්වා බර අනුව පොතු කැබලි අඩංගු විය හැකි ය. වෙනත් බාහිර ද්‍රව්‍ය 2%ට වඩා අඩංගු නො විය යුතු ය.

5. පොතු කැබලි

මේරූ, තද, ගැල්විය නො හැකි පිටත සුඹුල සහිත කොළ මිශ්‍ර දුඹුරු පැහැති පොතු මේ නමින් හඳුන්වයි. මෙය කෝටුවලින් ගලවා ගත නො හැකි නිසා සූරා වෙන් කර ගත යුතුය. මෙහි වෙනත් බාහිර ද්‍රව්‍ය 2%ට වඩා අඩංගු නොවිය යුතු ය.

6. අඹරන ලද කුරුඳු

බාහිර අපද්‍රව්‍යවලින් තොර අඹරන ලද කුරුඳුවලින් ලබා ගන්නා කුඩු ය.

7. සම්පූර්ණ කුරුඳු

කුරුඳු කුඩු හැර වෙළෙඳපොළෙහි ඇති අනෙකුත් සියලු ම කුරුඳු නිෂ්පාදන මෙලෙස හඳුන්වයි.

8. මල් ගොරහැඩි හා ගොරහැඩි

කුරුඳු කුරුවල මතුපිට හට ගන්නා රතු දුඹුරු පැහැති පුල්ලි මේ නමින් හැඳින්වේ. මේවා පසු ව තද දුඹුරු පැහැති ලප බවට පත්විය හැකි ය. එවිට ඒවා ගොරහැඩි නමින් හැඳින්වේ.

9. කුරුඳු මිටි

අපනයනය කිරීම සඳහා එක ම ශ්‍රේණියකට අයත් කුරු එකට තබා සුදුසු ද්‍රව්‍යයකින් බඳින ලද කුරුඳු කුරු මිටියක් මෙලෙස හඳුන්වයි. මෙම මිටියක උස හා බර සම්මතවලට අනුකූල විය යුතු ය. (උස සෙන්ටි මීටර 105 (+/- 5) බර කිලෝ ග්‍රෑම් 45 හෝ 25ක් විය යුතු ය.)

(මූලාශ්‍රය - තාක්ෂණික ප්‍රකාශනය 5 - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව)

කුරුඳු වගාව සහ නිෂ්පාදනයේ දී මුහුණ දීමට සිදු වී ඇති අභියෝග

1.පිරිවැය ඉහළ යාම

ශ්‍රී ලංකාවේ කුරුඳු වගාවේ නඩත්තු සහ නිෂ්පාදන සැකසීම් සහ යෙදවුම් පිරිවැය ඉහළ යෑමේ ප්‍රවණතාවක් පවතී. විශේෂයෙන් පොහොර මිල ඉහළ යෑම, සැකසීමේ ශ්‍රම පිරිවැය ඉහළ යෑම ප්‍රධාන වේ. විශේෂයෙන් කුරුඳු තලන්නන්ගේ දැඩි හිඟයක් පවතී. වර්තමානයේ හෙක්ටයාර් 33,000ක පමණ වන කුරුඳු වගාව සඳහා දළ වශයෙන් පුහුණු කුරුඳු තලන්නන් 30,000 ක් පමණ සිටී. නමුත් අවම වශයෙන් කුරුඳු තලන්නන් 50,000ක් පමණ මේ සඳහා අවශ්‍ය වේ. විශේෂයෙන් ශ්‍රම වෙළෙඳපොළේ පවත්නා විවිධාංගීකරණය වූ වෙළෙඳපොළ අවස්ථා හේතුවෙන් දකුණු ලක මුහුද තීරය පුරා විසිරී සිටි තරුණ ශ්‍රමිකයන් ඉන් ඉවත් ව යන තත්ත්වයක් දැක ගත හැකි ය. මෙම රැකියාව සඳහා එතරම් පිළිගැනීමක් නොමැති වීම ද ඔවුන් එම රැකියාවෙන් ඈත් වීමට බලපා ඇත. මෙම ශ්‍රමිකයන්ගේ සේවය නිෂ්පාදනයේ ප්‍රමිතිය පවත්වා ගැනීම සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වේ.

මෑත දශකය තුළ කුරුඳු වගාකරුවන්ගේ කුරුඳු නිෂ්පාදනය සඳහා වන අභිප්‍රේරණය සහ අවධානය ක්‍රමයෙන් හීන වී යන තත්ත්වයක් දැක ගත හැකි ය. නිෂ්පාදනය සඳහා වන පිරිවැය ක්‍රම ක්‍රමයෙන් ඉහළ යෑමෙන් කුරුඳු නිෂ්පාදනයේ අගය වැඩි කරන්නන් සඳහා ප්‍රමාණාත්මක වාසි සහ සහයෝගය නො ලැබීමත් මෙයට හේතු වී තිබේ. එමෙන් ම අපගේ කුරුඳු නිෂ්පාදන මිලදී ගන්නන් සතු ව ඇති දැඩි කේවල් කිරීමේ ශක්තිය සහ පවත්නා ක්‍රමයේ ඇති දුර්වලතා හේතුවෙන් දැරීමට සිදු වී ඇති අමතර පිරිවැය ආවරණය කර ගැනීමේ ඉඩකඩ බොහෝ සීමාසහිත වී ඇත. එබැවින් දිනෙන් දින කුරුඳු නිෂ්පාදනයෙන් නිෂ්පාදකයන් ඈත් වීමක් දැක ගත හැකි ය.

2. යටිතල පහසුකම් අඩු බව

රට පුරා කුරුඳු වගාකරුවන් 250,000ක ප්‍රමාණයක් විහිදී සිටිය ද මෙසේ වගා කරන බොහෝ බිම් අයිති වන්නේ අඩු වගා බිම් හිමියන්ට ය. මෙවන් අඩු වගා බිම් හිමියන්ට තමන් විසින් නෙළා ගන්නා ලද කුරුඳු නිෂ්පාදන සැකසීමේ දී අපද්‍රව්‍යවලින් තොර ව පිරිසිදු ගුණාත්මක බවින් ඉහළ කුරුඳු නිෂ්පාදනය

කර ගැනීමට අවශ්‍ය යටිතල පහසුකම් මඳ බව දැඩි ගැටලුවක් වී ඇත. එබැවින් නිෂ්පාදනය කරනු ලබන කුරුඳුවල ගුණාත්මක බව කෙරෙහි මෙය දැඩි ව බලපා යි.

3. අගය එකතු කිරීමේ ඇති අඩුපාඩු

ශ්‍රී ලංකාවේ කුරුඳු අපනයනය කිරීමේ දී අගය එකතු කළ නිෂ්පාදනයන් වශයෙන් ඇත්තේ නිෂ්පාදිත 2-3කි. නමුත් කුරුඳු බහු විධ අවශ්‍යතාවන් සඳහා භාවිත කරනු ලබන බෝගයකි. නමුත් ප්‍රමාණවත් තරම් නිෂ්පාදිතයන් පරාසයක් නොමැති වීම අභියෝගයකි. කුරුඳු සඳහා නව ක්‍රමවේදයන් ප්‍රමුඛතාගත කිරීම මෙන් ම නව වෙළෙඳපොළ අංශ සොයා යාම අභියෝගයකි.

4. තත්ත්වයෙන් බාල කුරුඳු වෙළෙඳපොළ ආක්‍රමණය

ප්‍රමිතියෙන් ඉහළ හොඳ වර්ගයේ කුරුඳු නිෂ්පාදනයෙන් බැහැර වී ප්‍රමිතියෙන් බාල කුරුඳු වෙළෙඳපොළට එවීමේ ප්‍රවණතාවක් මෑත කාලීන ව දැක ගත හැකි ය. ඒ සඳහා ප්‍රධාන හේතුවක් වන්නේ ඉහළ ගුණාත්මක කුරුඳු නිෂ්පාදනයන් බිහි කළ ද, ඒවා මිලදී ගැනීමට ප්‍රමාණවත් ප්‍රාදේශීය අතරමැදි මිලදී ගන්නන්ගේ වෙළෙඳපොළ තවමත් සැකසී නොමැති වීමයි. දැනට කුරුඳු සඳහා ස්ථාපිත වී ඇති වෙළෙඳපොළ පහළ ශ්‍රේණියේ කුරුඳු මිලදී ගන්නන්ගේ ප්‍රාදේශීය වෙළෙඳපොළකි. එමෙන් ම කුරුඳු ගබඩා කිරීම සහ ප්‍රවාහනය නිසි ක්‍රමවේදයන්ට අනුව සිදු නො වීම නිසා පැන නගින සනීපාරක්ෂක සහ සෞඛ්‍ය ගැටලු දැක ගත හැකි ය. එමෙන් ම කුරුඳු වගා කරන්නන් සහ අතරමැදියන් අතර කුරුඳු සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර සම්මතයන් සහ පිරිවිතරයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැති වීම ද කුරුඳු නිෂ්පාදකයන්ගේ ප්‍රමිතිය අවම වීමට බලපා ඇත. එමෙන් ම කුරුඳු වගා කරන්නන්ට සාපේක්ෂ ව කුරුඳු නිෂ්පාදනයේ අතරමැදියන්/එකතුකරන්නන් සිටිනුයේ අතලොස්සකි. එබැවින් මෙම අතලොස්ස අතර කුරුඳු නිෂ්පාදන මිලදී ගැනීම සඳහා දැඩි තරගකාරී තත්ත්වයක් දැක ගත හැකි ය. මෙහි දී කුරුඳු නිෂ්පාදිතයේ ගුණත්වය පිළිබඳ අවධානය යොමු නො කර ඒවා මිලදී ගැනීමට මෙම අතරමැදිකරුවන් යොමු වී ඇති බැවින් කුරුඳු නිෂ්පාදිතයේ ගුණත්වය රැක ගැනීමට මරු පහරක් වී ඇත. තව ද ප්‍රමිති සහතිකයක් ලබා ගැනීම ඉතා වියදම් අධික කාර්යයක් වීම නිසා ඒ සඳහා යොමු නො වන තත්ත්වයක් දැක ගත හැකිය.

5. ප්‍රමිතිගත නො වන පැළ රෝපණ ක්‍රමවේද

පැළ රෝපනය සඳහා බොහෝවිට භාවිත කරනු ලබන ක්‍රමවේදය වන්නේ බීජ මගින් පැළ රෝපණය සිදු කිරීමයි. මෙම ක්‍රමය නව වගාවන්හි දී සහ පාළු සිටුවීමේ දී වැඩි වශයෙන් භාවිත කෙරේ. නමුත් මෙම බීජ රෝපණය සිදු කිරීමේ දී සමාන ආරයක ඇති ගුණාත්මක පැළ ලැබීමේ ඉඩකඩ සීමිත වේ. ගුණාත්මක බව අතින් විවිධ වෙනස්කම්වලින් යුක්ත පැළ ලැබීම සිදු වේ. එබැවින් ඉහළ ගුණාත්මක පැළ (රෝපණ ද්‍රව්‍ය) නිෂ්පාදිතයන්/වගාකරුවන් වෙත නොමැති වීම ගැටලු සහගත තත්ත්වයක් මතු කරයි. මේ සඳහා විකල්ප ක්‍රමයක් ලෙස අතු මගින් පැළ බෝ කිරීම සිදු කරනු ලබයි. ප්‍රමාණවත් පැළ ප්‍රමාණයක් ලබා ගැනීමට තරම් තාක්ෂණය භාවිත නො කිරීම වැනි දුෂ්කරතා මතු වී ඇත.

6. අපනයනය සඳහා ඇති සීමිත ඉඩකඩ

රටවල් සීමිත ප්‍රමාණයකට පමණක් කුරුඳු අපනයනය වීම ද අභියෝගයකි. වර්තමානයේ කුරුඳු අපනයනය සිදු වන ප්‍රධාන වෙළෙඳපොළවල් වන්නේ මෙක්සිකෝව, කොලොම්බියාව, පේරු සහ ජර්මනිය වේ. මෙක්සිකෝව කුරුඳු අපනයනය කරනු ලබන ප්‍රධාන රටක් වීම හේතුවෙන් සංකේන්ද්‍රීය අවදානමක් මතු කරනු ලබයි. එසේ ම අපේ රටේ කුරුඳු නිෂ්පාදනය ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රමාණවත් වෙළෙඳපොළක් නොමැති වීම ද කුරුඳු සඳහා ඇති ඉඩකඩ බැහැර කරයි. තව ද කුරුඳු සඳහා වන පර්යේෂණයන් අවම තත්ත්වයක පැවතීම ද කුරුඳු වෙළෙඳපොළ වර්ධනයට දැඩි බාධාවක් වී ඇත.

7. පාරම්පරික නිෂ්පාදන ක්‍රමයන්ගෙන් ඈත් නො වීම

කුරුඳු නිෂ්පාදන සැකසීමේ නිරත ශිල්පීන් පාරම්පරික පුරුදු ක්‍රම බැහැර කර නව ක්‍රමයට අනුගත කරවීමේ ආකල්පමය බාධාවක් පවතී. සාම්ප්‍රදායික ක්‍රමවේදය බොහෝ විට ශ්‍රම දායකත්වය තුළින් සිදු වන අතර වර්තමානයේ ශ්‍රමය සඳහා පවත්නා ඉහළ මිල මෙන් ම ශ්‍රමයේ ඇති හිඟතාව ද කුරුඳු සැකැස්ම සඳහා පිරිවැය ඉහළ යන සාධකයක් බවට පත් ව ඇත. කුරුඳු සැකසීම සඳහා විවිධ ආකාරයේ තාක්ෂණික වැඩි දියුණුවීම් පැවතිය ද මෙම ශිල්පීන් සාම්ප්‍රදායික ක්‍රමවලින් බැහැර නො වීම ගැටලු සහගත තත්ත්වයකි. කුරුඳු තලන්නන් මෙම කාර්යයේ නිරත වීමේ දී නිෂ්පාදිතවල ගුණත්වය සහ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ ව සැලකිල්ලක් සිදු නො කර පැය ගණනක් එක දිගට මෙම කාර්යය සිදු කරනු ලබයි. මෙම පියවරේ දී කුරුඳු සිවිය වෙත බාහිර පරිසරයෙන් විවිධ දේවල් සම්මිශ්‍රණය වීමේ අවදානමක් පවතී. මෙමගින් ගුණත්වය අඩුවේ. මෙය අධික පුහුණුවක් අවශ්‍ය මෙන් ම කාලය අධික ව ගත වන කටයුත්තක් වී ඇති බැවින් කුරුඳු නිෂ්පාදන අංශයේ වර්ධනයට එය ඉතා දැඩි අභියෝගයක් වී ඇත. එමෙන් ම මෙම සාම්ප්‍රදායික ක්‍රමවේද භාවිත කිරීමට හේතුවී ඇති අනෙකුත් කරුණු වන්නේ නව ක්‍රමවේදයන් සඳහා දරන්නට සිදු වන්නා වූ අධික පිරිවැය, ඒ සඳහා වන දැනුමේ අඩුකම සහ ආයෝජනයේ ප්‍රතිලාභය සම්බන්ධයෙන් වන විශ්වාසයේ මඳ බව, සමහර නව තාක්ෂණයන් ප්‍රායෝගික නො වීම වේ.

8. නම්‍යතාව පිළිබඳ ව වන මනා දැනුම

කුරුඳු වගාව ආශ්‍රිත ව නව තාක්ෂණික ක්‍රමවේදයන්, වගාකරුවන් සහ රැස්කරන්නන් අතර ඇති ගැටලු සාකච්ඡා කර ගැනීම, නව වෙළෙඳපොළවල් සොයා යෑම, රජයේ මැදිහත් වීමෙන් ලබා දෙනු ලබන අනුග්‍රහයන් පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීම යනාදිය පිළිබඳ ව මනාව සම්බන්ධීකරණය වූ ක්‍රමවේදයන් නොමැති වීම අභියෝගයකි.

9. විකල්ප නිෂ්පාදිතයන්ගේ ව්‍යාපෘතිය

එමෙන් ම කුරුඳු සඳහා ඇති විකල්ප නිෂ්පාදිත ලෝකය පුරා ප්‍රචලිත වීමක් ද දැක ගත හැකි ය. ගුණාත්මකභාවයෙන් අඩු වුව ද මිලෙහි පවත්නා අධික වෙනස්කම් නිසා කැෂියා නැමති කුරුඳු වර්ගය වර්තමානයේ බහුල ව ගනුදෙනු වේ. එය ශ්‍රී ලංකාවේ කුරුඳු වෙළෙඳපොළට ප්‍රධාන අභියෝගයක් වී ඇත.

කුරුඳු වගාව සඳහා ඇති බාධක ජය ගත හැක්කේ කෙසේද ?

1. නව තාක්ෂණය භාවිතය

කුරුඳු ඵලදාව ඉහළ නංවා ගැනීම සඳහා කුරුඳු නිෂ්පාදන සැකසීමේ සාම්ප්‍රදායික ආකල්පවලින් මිදී නව තාක්ෂණය භාවිතයෙන් වඩාත් ඵලදායී කුරුඳු නිෂ්පාදන වෙත යොමු වීමෙන් නිෂ්පාදන පිරිවැය අවම කර ගත හැකි වනු ඇත. විශේෂයෙන් පොහොර මිල පාලනය කරමින් කුරුඳු වගාකරුවන් දිරිගැන්වීම සඳහා සහනදායී ලෙස පොහොර ලබා දීමෙන් රජයේ මැදිහත්වීමක් සිදු කළ හැකි ය. එසේ ම කුරුඳු තලන්නන් සඳහා මනා පුහුණුවක් ඇති කර මෙම කුරුඳු තැලීමේ කාර්යයේ නිරත ශ්‍රමිකයන් සඳහා මනා පිළිගැනීමක් ඇති කරවිය යුතු ය.

2. යටිතල පහසුකම් වර්ධනය කර ගැනීම

කුරුඳු නිෂ්පාදනයේ නිරතඅඩු වගා බිම් හිමියන් හට අපද්‍රව්‍යවලින් තොර පිරිසිදු ගුණාත්මක කුරුඳු නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය වන යටිතල පහසුකම් සපයා ගැනීමට බැංකු හරහා අඩු පොලී සහිත ණය පහසුකම් ලබා දිය යුතු ය. එසේ ම මෙම යටිතල පහසුකම් වර්ධනය කර ගැනීමේ අවශ්‍යතාව පිළිබඳ ව කුරුඳු නිෂ්පාදනය කරන්නන් වෙත ප්‍රමාණවත් අවබෝධයක් ලබා දීමට කටයුතු කළ යුතු ය.

3. අගය එකතු කළ කුරුඳු නිෂ්පාදිත සහ වෙළෙඳපොළ ප්‍රවර්ධනය

කුරුඳු සඳහා අගය එකතු කරනු ලබන නිෂ්පාදනයන් පිළිබඳ ව නිෂ්පාදකයන් දැනුවත් කිරීම තුළින් කුරුඳු සඳහා අගය එකතු කළ නිෂ්පාදනයන්හි පරාසය වර්ධනය කර ගත හැකි වනු ඇත. එමෙන් ම මෙවන් අගය එකතු කළ නිෂ්පාදිතයන් සඳහා වෙළෙඳපොළ ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය විධිවිධාන යෙදිය යුතු ය.

4. ප්‍රමිතිය සහතික කිරීම

කුරුඳු නිෂ්පාදිතයන්හි ප්‍රමිතිය ආරක්ෂා කර ගැනීම සඳහා අඩු ප්‍රමිතියකින් යුතු නිෂ්පාදිත වෙළෙඳපොළට පැමිණීම අධෛර්යමත් කළ යුතු අතර, අවම ප්‍රමිති තත්ත්වය ඇතුළත් වන පරිදි නීති සකස් කළ යුතු ය.

එසේ ම කුරුඳු වගාකරන්නන් සහ අතරමැදියන් සඳහා කුරුඳු සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර සම්මතයන් සහ පිරිවිතරයන් පිළිබඳ දැනුම ලබා දීමට අවශ්‍ය කටයුතු යෙදිය යුතු ය. එසේ ම ප්‍රමිති සහතික ලබා ගැනීමට දරන්නට සිදුවන අධික පිරිවැය පිළිබඳ සැලකිල්ල යොමු කොට ඒ සඳහා සහතිකයක් ලබා දිය හැකි වැඩ පිළිවෙළක් සකස් කළ යුතු ය.

5. නිමි කුරුඳු භාණ්ඩ සඳහා ඉහළ අවධානය

ශ්‍රී ලංකාවේ කුරුඳු අපනයනය බොහෝ විට සිදුවන්නේ නිමි භාණ්ඩයක් වශයෙන් නොව අමුද්‍රව්‍යයක් වශයෙනි. නමුත් එය නිමි භාණ්ඩයක් බවට පත් කර අපනයනය කර ගත හැකි නම් ලබා ගත හැකි ආදායම ඉහළ යනු ඇත. එබැවින් කුරුඳු අමුද්‍රව්‍යයක් වශයෙන් අපනයනය කරන අතර ම, එමගින් නිමි භාණ්ඩ නිෂ්පාදනය කර අපනයන වෙළෙඳපොළට යොමු කරවීමට සැලසුම් කළ යුතු ව ඇත.

6. සක්‍රීය පැළ රෝපණ ක්‍රමවේදයන්

පැල රෝපණය සඳහා භාවිත කරන ක්‍රමවේද ඒ සඳහා වගකීම් ඇති ආයතනවල සක්‍රීය දායකත්වයක් පැවතිය යුතු අතර, ප්‍රමිතියෙන් ඉහළ රෝපණ ද්‍රව්‍ය වගාකරුවන් වෙත ලබා දීමට එම ආයතන ඍජු ව මැදිහත් විය යුතු ය.

7. නව අපනයන වෙළෙඳපොළවල් සොයා යාම

කුරුඳු සඳහා වන නව වෙළෙඳපොළවල් සොයා ගැනීමට ඒ සඳහා වගකීම් ඇති පාර්ශ්වයන් ඍජු ව දායකත්වයක් ලබා දිය යුතු ය. එසේ ම මෙහි දී දැනටමත් කුරුඳු අපනයනය කරන රටවලට අපනයන ප්‍රමාණය වැඩි කිරීමේ ඉඩකඩ පිළිබඳ ව ද සොයා බැලිය යුතු ය.

8. මනා සම්බන්ධීකරණය

කුරුඳු වගාව ආශ්‍රිත ව නව තාක්ෂණික ක්‍රමවේදයන් වගාකරුවන් සහ රැස්කරන්නන් අතර ඇති ගැටලු සාකච්ඡා කර ගැනීම, නව වෙළෙඳපොළවල් සොයා යෑම, වගාව සඳහා රජයේ මැදිහත්වීමෙන් ලබා දෙනු ලබන අනුග්‍රහයන් පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීම යනාදිය පිළිබඳ ව මනා සම්බන්ධීකරණය වූ හොඳ ක්‍රමවේදයක් ඇති කළ යුතු ය.

9. කුරුඳු ඵලදාව ඉහළ නංවා ගැනීම

බාල තත්ත්වයෙන් යුතු කැෂියා වැනි කුරුඳුවලට මුහුණ දිය හැකි පරිද්දෙන් ශ්‍රී ලංකාවේ සත්‍ය කුරුඳුවල නිෂ්පාදන පිරිවැය අවම කිරීමට අවශ්‍ය පියවර උපරිම ලෙස ගත යුතු අතර, හෙක්ටයාරයකට ලබා ගත හැකි ඵලදාව වැඩිකර ගැනීම සඳහා කරනු ලබන පර්යේෂණ අඛණ්ඩ ව සිදු කළ යුතු ය.■

නව සංවර්ධන බැංකුව හරිත හෙට දිනක් කරා...

විනීතා හේරත්
ප්‍රාදේශීය කළමනාකරු
ප්‍රාදේශීය කාර්යාලය - මාතලේ

පසුගිය දශකයේ ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපය වැනි ලෝක ආර්ථිකයේ දැවැන්තයන් ආර්ථික අවපාතයෙන් පීඩාවට පත්වෙද්දී ලෝක ආර්ථිකය ශක්තිමත් කිරීමේ සහ එය නව ඉසව්වක් කරා යොමුකිරීමේ අරමුණින් බ්‍රික්ස් (BRICS) සංවිධානය බිහිවිය. ඒ සඳහා බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව, චීනය සහ දකුණු අප්‍රිකාව එක් විය. "ලෝක ආර්ථිකයේ යහපත් හෙට දවස වෙනුවෙන් ඉදිවෙන බ්‍රික්ස් පවුර" යන හිසින් යුතුව අප විසින් මෙයට පෙර සටහන කලාපයකින් ඒ පිළිබඳව සාකච්ඡා කර ඇත.

බ්‍රික්ස් රාජ්‍ය නායක සමුළුව වසරකට වරක් පැවැත්වෙයි. එහි සිව්වැන්න 2012 මාර්තු 28 - 29 දෙ දින ඉන්දියාවේ නවදිල්ලි නගරයේ දී පැවැත්විනි. බ්‍රික්ස් සාමාජික රටවල් එක්ව ලෝක බැංකුව හෝ ආසියානු සංවර්ධන බැංකුව හෝ ස්වරූපයේ විකල්ප ණය දෙන්නෙක් ලෙස සංවර්ධන බැංකුවක් පිහිටුවීම පිළිබඳ යෝජනාව එම සමුළුවට ඉදිරිපත් විය. බ්‍රික්ස් සිවු වැනි සමුළුවේ වැදගත් ම කටයුත්ත වූයේත් මෙම බ්‍රික්ස් බැංකුව පිළිබඳ යෝජනාව ඉදිරිපත් කිරීම යි. ඒ අනුව බ්‍රික්ස් සාමාජික රටවල් සහ වෙනත් නැගී එන ආර්ථිකවල මෙන් ම සංවර්ධනය වෙමින් පවත්නා රටවල යටිතල පහසුකම් හා තිරසර සංවර්ධන ව්‍යාපෘති සඳහා අරමුදල් සම්පාදනය කිරීමට නව සංවර්ධන බැංකුවක් පිහිටුවීමට ඇති ශක්‍යතාව පිළිබඳ විමසා බැලීම සඳහා සාමාජික රටවල මුදල් අමාත්‍යවරුන්ගෙන් සමන්විත කමිටුවක් පත්කරන ලදි. ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව පදනම් කරගනිමින් බ්‍රික්ස් රටවල රාජ්‍ය නායකයෝ 2013 වසරේ දකුණු අප්‍රිකාවේ ඩර්බාන් හී පැවති 5 වැනි බ්‍රික්ස් රාජ්‍ය නායක සමුළුවේ දී බ්‍රික්ස් බැංකුවක් පිහිටුවීම පිළිබඳ එකඟතාවට පැමිණියහ. එකී එකඟතාව අනුව මේ වන විට බ්‍රික්ස් බැංකුව පිහිටුවා ඇත. එම බැංකුවේ ගමන් මඟ, සාමාජික රටවල යටිතල පහසුකම් හා තිරසර සංවර්ධන ව්‍යාපෘති සඳහා, විශේෂයෙන් ම බ්‍රික්ස් සාමාජික රටවල පුනර්ජනනීය බලශක්ති අරමුණු ඉටුකිරීමෙහිලා ආරම්භකර ඇති කාර්යභාරය සහ සාමාජික රටවල පුනර්ජනනීය බලශක්ති අවශ්‍යතා පිළිබඳව මෙම ලිපිය මඟින් සැකෙවින් විමසාබැලීමට අපේක්ෂිත ය.

බ්‍රික්ස් බැංකුවේ ගමන් මඟ

බ්‍රික්ස් බැංකුවට පදනම දැමෙයි...

වසරකට වරක් පැවැත්වෙන බ්‍රික්ස් රාජ්‍ය නායක සමුළුවේ 6 වැන්න 2014 ජූලි මස බ්‍රසීලයේ ෆෝටලීසා නගරයේ පැවති අතර එහි දී බ්‍රික්ස් සංවිධානයේ සුවිශේෂී ඓතිහාසික අවස්ථාවක් සනිටුහන් කරමින් බ්‍රික්ස් බැංකුව පිහිටුවීම පිළිබඳ එකඟතා ගිවිසුමට (Articles of Agreement - AoA) අත්සන් තබන ලදි. මෙය වඩාත් ප්‍රචලිත ෆෝටලීසා ප්‍රකාශය නමිනි. බැංකුව නම් කෙරුනේ නව සංවර්ධන බැංකුව නමිනි (New Development Bank - NDB). බැංකුවේ අරමුණු, කාර්යයන්, සාමාජිකත්වය, ඡන්ද බලය, ප්‍රාග්ධනය හා කොටස්, ප්‍රධාන කාර්යාලය පිහිටුවීම, සංවිධානය හා කළමනාකරණය ආදි කරුණු රැසක් එකඟතා ගිවිසුමට ඇතුළත් විය.

1. අරමුණු සහ කාර්යයන්

නව සංවර්ධන බැංකුවේ ප්‍රධානතම අරමුණ බ්‍රික්ස් සාමාජික රටවල සහ වෙනත් නැගී එන ආර්ථිකවල සහ සංවර්ධනය වෙමින් පවත්නා රටවල යටිතල පහසුකම් හා තිරසර සංවර්ධන ව්‍යාපෘති සඳහා සම්පත් සම්පාදනය යි.

එම අරමුණු සපුරාලනු වස් රාජ්‍ය හෝ පෞද්ගලික හෝ ව්‍යාපෘති සඳහා බැංකුව ණය, ඇපකර, කොටස් සහ වෙනත් මූල්‍ය උපකරණ ඔස්සේ ආධාර කරයි. එමෙන් ම එය ජාත්‍යන්තර සංවිධාන සහ වෙනත් මූල්‍යායතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමටත් බැංකුව විසින් සහාය දක්වන ව්‍යාපෘති සඳහා තාක්ෂණික සහාය සැපයීමටත් එකඟවී ඇත.

2. සාමාජිකත්වය, ඡන්ද බලය, ප්‍රාග්ධනය සහ කොටස්

බැංකුවේ ආරම්භක සාමාජිකයන් වනුයේ බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව, චීනය සහ දකුණු අප්‍රිකාව යි. එහෙත් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවලට ද කොන්දේසිවලට යටත්ව බැංකුවේ සාමාජිකත්වය ලබාගත හැක. ඒ අනුව එකඟතා ගිවිසුමේ සඳහන් පරිදි කිසිදු අවස්ථාවක බ්‍රික්ස් ආරම්භක සාමාජිකයන්ගේ හිමිකාරත්වය ඡංද බලයෙන් සියයට 55ට නො අඩු විය යුතුය.

බැංකුවෙහි අනුදත් ප්‍රාග්ධනය (authorized capital) එක්සත් ජනපද ඩොලර් බිලියන 100 කි. එය කොටසක වටිනාකම එ.ජ. ඩොලර් 100,000 ක් වූ කොටස් මිලියනයකින් සමන්විතය. (01 වැනි වගුව) සහභාග ප්‍රාග්ධනය (subscribed capital) එක්සත් ජනපද ඩොලර් බිලියන 50 කි. එයින් එක්සත් ජනපද ඩොලර් බිලියන 10ක් පළමු අදියරේ බැංකුවට මුදලින් ගෙවිය යුතු වූ අතර (paid-in capital) එය වාරික 7 කින් ගෙවිය යුතු විය. අවශ්‍ය වූ විට බැංකුවට සැපයීමට කොටස් හිමියන් එකඟ වූ ප්‍රාග්ධනය (callable capital) එක්සත් ජනපද ඩොලර් බිලියන 40 කි.

3. මූලස්ථානය, සංවිධානය සහ කළමනාකරණය

ෆෝටලීසා ගිවිසුම මගින් නව සංවර්ධන බැංකුවේ මූලස්ථානය චීනයේ ෂැංහයි නගරයේ පිහිටුවීමට සියලු ම සාමාජික රටවල් විසින් එකඟ වී ඇත. පළමු කලාපීය කාර්යාලය දකුණු අප්‍රිකාවේ ජොහැන්ස්බර්ග් නගරයේ පිහිටුවීමට එකඟ වූහ.

නව සංවර්ධන බැංකුවේ සංවිධාන ව්‍යුහය අධිපති මණ්ඩලයක්, අධ්‍යක්ෂ මණ්ඩලයක්, සභාපති හා උප සභාපතිවරුන් ප්‍රධාන කොටගත් කාර්ය මණ්ඩලයකින් සමන්විත යුතු බව එකඟතා ගිවිසුමේ ඇතුළත් විය. අධිපති මණ්ඩලය විසින් එහි එක් අයෙකු වාර්ෂික ව සභාපති තනතුරට පත් කෙරෙනු ඇත. උප සභාපතිවරුන් සංඛ්‍යාව සිවු දෙනෙකි. නව සංවර්ධන බැංකුවේ ප්‍රථම සභාපතිත්වය ඉන්දියාවට පිරිනැමීමට ගිවිසුම මගින් එකඟ වී ඇත.

බැංකුවේ සාමාන්‍ය කටයුතු පවත්වාගෙන යෑම අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පාලන කටයුතුවල විනිවිදභාවය තහවුරු කෙරෙනු වස් විගණන, අවදානම් සහ අයවැය කමිටුව, ණය සහ ආයෝජන කමිටුව සහ මූල්‍ය කමිටුව ආදි කමිටු පිහිටුවා ඇත.

1 වැනි වගුව — නව සංවර්ධන බැංකුවේ කොටස් හිමිකාරිත්වය

රට	කොටස් සංඛ්‍යාව	කොටස් හිමිකාරිත්වයේ ප්‍රතිශතය (සමස්ත කොටස් සංඛ්‍යාවෙන් %)	ඡන්ද හිමිකම (සමස්ත ඡන්ද සංඛ්‍යාවෙන් %)
බ්‍රසීලය	100,000	20	20
රුසියාව	100,000	20	20
ඉන්දියාව	100,000	20	20
චීනය	100,000	20	20
දකුණු අප්‍රිකාව	100,000	20	20
බෙදා වෙන් නොකළ කොටස්	500,000	-	-
එකතුව	1,000,000	100	100

මූලාශ්‍රය - https://www.ndb.int/

බ්‍රික්ස් බැංකුව හෙවත් නව සංවර්ධන බැංකුව ගොඩනැගෙයි...

බ්‍රික්ස් 7 වැනි රාජ්‍ය නායක සමුළුව 2015 ජූලි 07 වැනි දින රුසියාවේ උෆා (Ufa) නගරයේ පැවැත්විනි. එදින සන්ධ්‍යාවේ රුසියානු මුදල් ඇමතිවරයාගේ මුලසුනින් යුතුව නව සංවර්ධන බැංකුවේ අධිපතිවරුන්ගේ සමාරම්භක රැස්වීම පැවැත්විනි. එහිදී ෆෝටලීසා ප්‍රකාශයෙන් එකඟ වූ පරිදි නව සංවර්ධන බැංකුවේ සභාපති ධුරය සඳහා ඉන්දීය ජාතික කේ. වී. කමාත් පත්කර ගන්නා ලදි. එමෙන් ම උප සභාපති ධුර 4 හා අධ්‍යක්ෂ මණ්ඩලය පත්කරගැනීම ද මෙහි දී සිදු විය.

නව සංවර්ධන බැංකුවේ මූලස්ථානය චීනයේ ෂැංහයි නගරයේ පිහිටුවීම සම්බන්ධ ගිවිසුමට චීන රජය සහ නව සංවර්ධන බැංකුව විසින් 2016 පෙබරවාරි 27 වැනි දින අත්සන් තබන ලදි. එහි දී චීන රජය වෙනුවෙන් විදේශ කටයුතු ඇමති වැං යී ද නව සංවර්ධන බැංකුව වෙනුවෙන් එහි සභාපති කේ. වී. කමාත් ද අත්සන් කළහ. ඒත් සමගම ෂැංහයි නාගරික පාලනය හා නව සංවර්ධන බැංකුව විසින් අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීම ද සිදුවිය. ඒ සඳහා ෂැංහයි නගරාධිපති යැං ෂියොං හා කේ. වී. කමාත් අත්සන් තැබූහ. ඒත් සමගම නව සංවර්ධන බැංකුවේ කටයුතු ඇරඹිනි.

ඒ අනුව නව සංවර්ධන බැංකුව පිහිටුවා මේ වන විට දෙවසරක් ගෙවී ඇති අතර 2016 වසර සඳහා වූ වාර්ෂික වාර්තාව හරිත හෙට දිනක් කරා (Towards Greener Tomorrow) යන තේමාවෙන් යුතුව නිකුත්කර ඇත.

හරිත හෙටක මුල් පියවර

හරිත අනාගතයක් පිළිබඳ නව සංවර්ධන බැංකුවේ අපේක්ෂාවන් සඳහා ශක්තිමත් ප්‍රවේශයක් ලබා දෙමින් 2016 අප්‍රේල් 15 වැනි දින නව සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එක්සත් ජනපද ඩොලර් මිලියන 811ක් වූ ප්‍රථම ව්‍යාපෘති ණය කාණ්ඩය අනුමත කරන ලදි. ඒ මෙගාවොට් (MW) 2370 ධාරිතාවකින් යුත් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති 4 ක් සඳහා ය. (02 වැනි වගුව) මෙම ව්‍යාපෘති මඟින් පුනර්ජනනීය බලශක්ති භාවිතය ඔස්සේ හරිතාගාර

02 වැනි වගුව නව සංවර්ධන බැංකුව විසින් අනුමත කරන ලද ප්‍රථම ණය කාණ්ඩය

රට	ණය මුදල)	ව්‍යාපෘතිය	අරමුණ සහ ඉලක්කය
බ්‍රසීලය	එ.ජ. ඩොලර් මිලියන 300	සුළං හා සූර්ය බලය වැනි පුනර් ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා	මෙ.වො. 600 පුනර්ජනනීය බලශක්ති උත්පාදනය
			වසරකට ටොන් 1,000,000 කාබන්ඩයොක්සයිඩ් (CO_2) දහනය වැළැක්වීම
චීනය	(රෙන්මින්බි මිලියන 525) එ.ජ. ඩොලර් මිලියන 81	වහළ මත සවි කෙරෙන සූර්ය බල පැනල ව්‍යාපෘති සඳහා	මෙ.වො. 100 සූර්ය බලශක්ති උත්පාදනය
			වසරකට ටොන් 73,000 කාබන්ඩයොක්සයිඩ් (CO_2) දහනය වැළැක්වීම
ඉන්දියාව	එ.ජ. ඩොලර් මිලියන 250	සුළං හා සූර්ය බලය වැනි පුනර් ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා	මෙ.වො. 500 පුනර්ජනනීය බලශක්ති උත්පාදනය
			වසරකට ටොන් 815,000 කාබන්ඩයොක්සයිඩ් (CO_2) දහනය වැළැක්වීම
දකුණු අප්‍රිකාව	(එ.ජ. ඩොලර් මිලියන 180	පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා	මෙ.වො. 670 පුනර්ජනනීය බලශක්ති උත්පාදනය
			වසරකට ටොන් 1,300,000 කාබන්ඩයොක්සයිඩ් (CO_2) දහනය වැළැක්වීම

මූලාශ්‍රය - https://www.ndb.int/

වායු දහනය ටොන් මිලියන 4කින් පමණ අඩු වේ යැයි ඇස්තමේන්තුකර ඇත.

නව සංවර්ධන බැංකුව විසින් අනුමත කරන ලද පළමු ණය කාණ්ඩය මුලුමනින් ම පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති කෙරෙහි යොමු වීම තුළින් පැහැදිලි වන්නේ පුනර්ජනනීය බලශක්තිය අවශ්‍යතා සඳහා බ්‍රික්ස් සාමාජික රටවලින් වැඩිවෙමින් පවත්නා ඉල්ලුමයි.

බ්‍රික්ස් සාමාජික රටවල පුනර්ජනනීය බලශක්ති ඉලක්ක සහ ඒවා ළඟාකර ගැනීමට නව සංවර්ධන බැංකුවේ සහය

ලෝක දළ දේශීය නිෂ්පාදිතය සඳහා 2000 වසරේ සියයට 8ක් වූ බ්‍රික්ස් රටවල දායකත්වය 2017 වසරේ සියයට 24 දක්වා ඉහළ ගොස් ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අනුව 2017 දළ දේශීය නිෂ්පාදිතයේ විශාලත්වය අනුව ලොව රටවල් පෙළගැස්වීමේ දී පළමු රටවල් 10 අතරට බ්‍රික්ස් රටවල් 3 ක් ඇතුළත් වේ. ඒ අනුව චීනය දෙවැනි ස්ථානයත් ඉන්දියාව හය වැනි ස්ථානයත් බ්‍රසීලය අට වැනි ස්ථානයත් උසුලයි. දේශගුණ විපර්යාස පිළිබඳ පැරිස් සම්මුතියට අත්සන් තබා ඇති මෙම රටවල් ස්වකීය රටවල හරිතාගාර වායු විමෝචනය සීමාකිරීමට එකඟ වී සිටී. මේ සඳහා ස්වෙච්ඡා ප්‍රවේශයක් ලෙස තම රටවල හරිතාගාර වායු විමෝචනය සීමාකිරීම සඳහා වූ ඉලක්ක හා යෝජනා ඇතුළත් අපේක්ෂිත ජාතික නිර්ණිත දායකත්ව (Intended Nationally Determined Contributions - NDCs) එකඟතාවක් ගොඩනගාගෙන ඇත. මෙම අරමුණු ඉටුකරගැනීමෙහිලා බ්‍රික්ස් රටවල් පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර කෙරෙහි අවධානය යොමුකරයි.

බ්‍රික්ස් සාමාජික රටවල බලශක්ති සැපයුම් මූලාශ්‍ර පිළිබඳව විමසා බැලීමේ දී ඇතැම් රටවල් මේ වන විටත් පුනර්ජනනීය බලශක්ති සැපයුම කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වන අතර ඇතැම් රටවල් ෆොසිල ඉන්ධන භාවිතය කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වන බැව් පැහැදිලි වේ. උදාහරණ වශයෙන් 2015 වසරේ බ්‍රසීලයේ සමස්ත විදුලි බල සැපයුමෙන් සියයට 74ක් ෆොසිල නොවන ඉන්ධන මඟින් සැපයිනි. එරට බලශක්ති අපේක්ෂා සැලැස්මට අනුව 2014 වසරේ ගිගා වොට් (Gigawatts - GW) 106.4ක් වූ පුනර්ජනනීය බලශක්ති සැපයුම 2024 වන විට ගිගා වොට් 173.6ක් දක්වා ඉහළ නැංවීමට අපේක්ෂිත ය. (03 වැනි වගුව)

බ්‍රසීලය දකුණු ඇමෙරිකානු රටවල් අතර විශාලතම ආර්ථිකය හිමි රටයි. එය දකුණු ඇමෙරිකාවේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 55කට වඩා වැඩි ප්‍රතිශතයකින් දායක වේ. එහෙත් සංවර්ධනය වෙමින් පවත්නා අනෙකුත් බොහෝ රටවල් මෙන් ම බ්‍රසීලයේ ද යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වන ආයෝජන ප්‍රමාණවත් නොවන බැව් දක්නට ලැබේ. මෙය රටේ සමස්ත යටිතල පහසුකම් ව්‍යුහය තුළ විශාල දායකත්වයක් උසුලනු ලබන බලශක්ති ක්ෂේත්‍රය කෙරෙහි අහිතකර ආකාරයෙන් බලපායි. බ්‍රසීලයේ බලශක්ති ක්ෂේත්‍රය ජලවිදුලිබලය මත යැපීමේ පරිමාව විශාල වන බැවින් ජල විදුලි බල උත්පාදනය තුළ සිදුවන වෙනස්කම් රටේ සමස්ත විදුලිබල ධාරිතාව කෙරෙහි අහිතකර

03 වැනි වගුව **බ්‍රික්ස් සාමාජික රටවල පුනර්ජනනීය බලශක්ති ඉලක්ක**

රට	පුනර්ජනනීය බලශක්ති ඉලක්කය (ගිගා වොට්)	පුනර්ජනනීය බලශක්ති ඉලක්කය ජයගැනීම සඳහා අවශ්‍ය ආයෝජනය (එ.ජ. ඩොලර් බිලියන)	ඉලක්ක වර්ෂය
බ්‍රසීලය	173.6	121.3	2024
රුසියාව	73.5	44.0	2020
ඉන්දියාව	225.3	157.7	2022
චීනය	761.0	622.0	2020
දකුණු අප්‍රිකාව	17.8	30.0	2030
එකතුව	1251.2	975.0	

මූලාශ්‍රය - Institute of Energy Economics and Financial Analysis

ආකාරයෙන් බලපෑ හැකි ය. මේ පිළිබඳව අවධානය යොමු කරමින් බ්‍රසීලය සූර්ය හා සුළං බලය වැනි පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර කෙරෙහි අවධානය යොමුකර ඇත. නව සංවර්ධන බැංකුවේ ප්‍රථම ණය කාණ්ඩය තුළ බ්‍රසීලයේ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහාවූ එ.ජ.ඩො. මිලියන 300ක ණය මුදලක් සඳහා අනුමැතිය ලැබෙන්නේ එවන් පසුබිමක ය. එය බ්‍රසීලයේ ජලවිදුලි බලය මත යැපීම අඩුකිරීමටත් බලශක්ති සැපයුම විවිධාංගීකරණය කිරීමටත් හේතු වනු ඇත.

2015 වසරේ චීනයේ සමස්ත බලශක්ති සැපයුමෙන් සියයට 74ක් ම ෆොසිල ඉන්ධන භාවිතයෙන් සිදුකෙරිනි. 2015 වසරේ එරට සූර්ය බලශක්ති සැපයුම ගිගා වොට් 43ක් වූ අතර 2020 වන විට එය ගිගා වොට් 127 දක්වා ඉහළ නැංවීමට ඉලක්කකර ඇත. ලොව විශාලතම සුළං බලශක්ති සැපයුම් ධාරිතාව සහිත රට චීනයයි. ධාරිතාව ගිගාවොට් 145ක් පමණ වේ. එය යුරෝපීය හවුලේ මුලු සුළං බල ධාරිතාවටත් වඩා ඉහළ ය. 2015 වසරේ ගිගා වොට් 145ක් වූ සුළං බලශක්ති සැපයුම 2020 දී ගිගා වොට් 250 දක්වාත් 2015 වසරේ දී ගිගා වොට් 320ක් වූ ජල විදුලි සැපයුම 2020 දී ගිගා වොට් 384 දක්වාත් ඉහළ නැංවීම චීනයේ පුනර්ජනනීය බලශක්ති ඉලක්කය යි. මෙකී ඉලක්කය ළඟා කර ගැනීම සඳහා චීනය පියවර රැසක් ගෙන ඇති අතර චීනයේ ෂැංහයි ලිංයැං කාර්මික කලාපයේ (China Shanghai Lingang Industrial Zone) වහළ මත සවිකෙරෙන සූර්ය පැනල ඔස්සේ බලශක්ති ජනනය කිරීමේ ව්‍යාපෘතිය ඉන් එක් පියවරකි. නව සංවර්ධන බැංකුව විසින් මෙම ව්‍යාපෘතිය සඳහා අනුමත කරන ලද ණය මුදල රෙන්මින්බි මිලියන 525කි. එමෙන් ම එමඟින් වසරකට මෙගවොට් 100 විදුලි ජනනයක් අපේක්ෂිත අතර ව්‍යාපෘතිය හේතුවෙන් වසරකට ටොන් 73,000ක කාබන්ඩයොක්සයිඩ් දහනයක් වැළැක්විය හැකි බවට ඇස්තමේන්තු කර ඇත.

ඉන්දියාවේ සමස්ත බලශක්ති සැපයුම තුළ පුනර්ජනනීය බලශක්ති සැපයුම සියයට 17ක් පමණ වේ. 2022 වන විට එය සියයට 25 දක්වාත් 2030 වන විට සියයට 40 දක්වාත් ඉහළ නැංවීමට අපේක්ෂිත ය. ඒ අනුව 2016 දී ගිගා වොට් 97ක් වූ පුනර්ජනනීය බලශක්ති සැපයුම ගිගා වොට් 225 දක්වා ඉහළ නැංවීමට අපේක්ෂිත ය. නව සංවර්ධන බැංකුව විසින් අනුමත කරන ලද පළමු ණය කාණ්ඩයෙන් ඉන්දියාව සඳහා අනුමත කරන ලද එ.ජ.ඩො. මිලියන 250ක් වූ ණය මුදල සුළං බලශක්ති, සූර්ය බලශක්ති, කුඩා පරිමාණ ජල විදුලිබලාගාර, ජෛව ඉන්ධන, භූතාප (geo-thermal), අපද්‍රව්‍ය බලශක්තිය බවට හැරවීම ආදී ව්‍යාපෘතිවල ආයෝජනය සඳහා සැලසුම්කර ඇත.

දකුණු අප්‍රිකාවේ සමස්ත බලශක්ති සැපයුමෙන් සියයට 94ක් ෆොසිල ඉන්ධන භාවිතයෙන් සිදු කෙරෙයි. 2015 වසරේ පුනර්ජනනීය බලශක්ති සැපයුම ගිගා වොට් 1.8ක් වූ අතර 2016 දී එම ප්‍රතිශතය ගිගා වොට් 2.1ක් විය. 2030 වන විට එ රට ළඟාකර ගැනීමට අපේක්ෂිත පුනර්ජනනීය බලශක්ති ඉලක්කය ගිගා වොට් 17.8කි. මෙම ඉලක්ක ජය ගැනීම සඳහා දකුණු අප්‍රිකාව මේ වන විටත් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති වෙත යොමුවී ඇත. නව සංවර්ධන බැංකුවේ ප්‍රථම ණය කාණ්ඩය තුළ අනුමත කරන ලද එ.ජ.ඩො. මිලියන 180ක් වූ ණය මුදල එසේ පුනර්ජනනීය බලශක්ති ආයෝජන ව්‍යාපෘතියක් වෙනුවෙන් ලබා දී ඇත. මෙම ව්‍යාපෘතිය මගින් මෙ.වො. 670ක බලශක්ති ප්‍රමාණයක් උත්පාදනය කිරීමට සැලසුම්කර ඇත. මෙය 2020- 2021 එරට ළඟාකර ගැනීමට අපේක්ෂිත පුනර්ජනනීය බලශක්ති ඉලක්කය ළඟා කරගැනීමට සියයට 10කින් දායක වනු ඇත.

රුසියාවේ ප්‍රයෝජනයට නොගත් පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර රැසක් ඇත. 2015 වසරේ එ රට විදුලි බල සැපයුම තුළ පුනර්ජනනීය බලශක්ති සැපයුම සියයට 16ක් පමණ විය. එය 2020 වන විට සියයට 4.5කින් ඉහළ දැමීමට සැලසුම්කර ඇත. මෙම ඉලක්ක ජයගැනීම සඳහා ගිගා වොට් 22කින් පුනර්ජනනීය බලශක්ති ධාරිතාව ඉහළ නැංවිය යුතු ය. කෙසේ වෙතත් නව සංවර්ධන බැංකුව විසින් 2016 වසරේ අනුමත කරන ලද ප්‍රථම ණය කාණ්ඩය තුළ රුසියාව සඳහා ණය අනුමත වීමක් සිදු නොවුනි. එහෙත් ප්‍රථම ව්‍යාපෘති ණය අනුමැතියෙන් පසුව රුසියාවේ කුඩා ජලවිදුලි බලාගාර 2 ක් සඳහා එ.ජ.ඩොලර් මිලියන 100 ණය මුදලක් නව සංවර්ධන බැංකුව විසින් අනුමත කරන ලදී. ඒ කරෙලියා (Karelia) ප්‍රදේශයේ කුඩා ජලවිදුලිබල ව්‍යාපෘති 2ක් වෙනුවෙනි. මෙම ප්‍රදේශයේ බලශක්ති ජනන ධාරිතාව ඉතාමත් ම පහළ මට්ටමක පවතින අතර ප්‍රදේශයට බලශක්තිය ලබාගැනෙනුයේ රුසියාවේ වෙන් ප්‍රදේශවලිනි. එහෙත් එසේ ලබාගන්නා බලශක්ති සැපයුමද ප්‍රමාණවත් නොවේ. නව සංවර්ධන බැංකුව විසින් අනුමත කරන ලද ණය මුදලට අදාළ ව්‍යාපෘතියෙහි වැඩකටයුතු 2016 ඔක්තෝබර් මස අරඹා ඇත. ඒ යටතේ කුඩා වේල්ලක් හා

ජලවිදුලි උත්පාදන පර්යන්ත 2ක් ඉදිකිරීමට සැලසුම්කර ඇත. එම ව්‍යාපෘතිය මඟින් පුනර්ජනනනීය බලශක්ති මෙ.වො. 49.8ක් උත්පාදනය කිරීමට අපේක්ෂිත ය. එමගින් වසරකට කාබන්ඩයොක්සයිඩ් ටොන් 48,000ක් දහනයවීම වැළැක්විය හැකි බව ඇස්තමේන්තු කර ඇත. මෙම ව්‍යාපෘතිය "කුඩා පරිමාණ ජලවිදුලිබල උත්පාදනය-විසල් ජයග්‍රහණ" (Small-scale Power Generation-Big Achievements) ලෙස 2017 වසරේ හොඳ ම ව්‍යාපෘතිය ලෙස රුසියාවේ වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ දී තෝරා ගැණිණි. ව්‍යාපෘතියේ වැඩ 2019 වසරේ අවසන් කිරීමට සැලසුම්කර ඇත.

2016 නොවැම්බර් 22 වැනි දින නව සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය චීනයේ සහ ඉන්දියාවේ ව්‍යාපෘති 2 ක් සඳහා ණය අනුමත කර ඇත. චීනය සඳහා අනුමත කරන ලද ණය මුදල පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතියක් සඳහා අනුමත කරන ලද අතර ඉන්දියාව සඳහා අනුමත කරන ලද ණය මුදල මහාමාර්ග පද්ධතියේ වැඩි දියුණු කිරීමක් සඳහා ය.

චීනය සඳහා අනුමත කරන ලද මුදලේ වටිනාකම රෙන්මින්බි බිලියන 2 (එ.ජ.ඩො. මිලියන 298) කි. මෙය චීනයේ ෆූෂියැං (Fujian) පළාතේ මෙ.වො. 250 ධාරිතාවෙන් යුත් අක් වෙරළ සුළං බල ව්‍යාපෘතියක් සඳහා ලබා දී ඇත. එය චීනයේ අග්නිදිග වෙරළේ පිහිටි ෆූෂියැං ප්‍රදේශය ආශ්‍රිත මුහුදුදේ ඉදිකෙරෙන ව්‍යාපෘතිය පුතියැං පිංහයි බොක්ක අක්වෙරළ සුළං බල ව්‍යාපෘතිය (Putian Pinhai Bay Offshore Wind Power Project) ලෙස හැඳින්වෙයි. මෙම ව්‍යාපෘතිය මගින් වසරකට කාබන්ඩයොක්සයිඩ් ටොන් 869,900 ක් දහනය වීම වැලකෙනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

බ්‍රික්ස් සාමාජික රටවල් කණ්ඩායමක් ලෙස ගත් විට වසර 2030 වන විට මහා පරිමාණ ජලවිදුලි බලය ද ඇතුළත්ව ගිගා වොට් 1251ක ධාරිතාවෙන් යුත් පුනර්ජනනීය බලශක්ති ඉලක්කයක් පිහිටුවා ඇත. සාමාජික රටවල් අතරින් චීන සහ ඉන්දියා දෙරටෙහි පුනර්ජනනීය බලශක්ති ඉලක්ක සාපේක්ෂ ව විශාලය. වසර 2020 වන විට ගිගා වොට් 253ක පුනර්ජනනීය බලශක්ති ප්‍රමාණයක් බලශක්ති ක්ෂේත්‍රයට එක් කිරීම චීනයේ ඉලක්කය යි. ඉන්දියාවේ ඉලක්කය වසර 2022 වන විට ගිගා වොට් 138ක පුනර්ජනනීය බලශක්ති ප්‍රමාණයක් එරට බලශක්ති ක්ෂේත්‍රයට එක් කිරීම යි.

පුනර්ජනනීය බලශක්ති ඉලක්ක වෙත ළඟා වීමට දරන ප්‍රයත්නයේ දී බ්‍රික්ස් සංවිධානයට අයත් රටවල් මෙන් ම සංවර්ධනය වෙමින් පවත්නා බොහෝ රටවල් ද මුහුණ දෙන ප්‍රධානතම ප්‍රශ්නය වන්නේ ප්‍රමාණවත් අරමුදල් නොමැතිවීම යි.

බ්‍රසීලයේ 2014 - 2024 පුනර්ජනනීය බලශක්ති ඉලක්ක ජය ගැනීම සඳහා එ.ජ. ඩොලර් බිලියන 121ක එනම් වාර්ෂිකව එ.ජ. ඩොලර් බිලියන 12ක් පුනර්ජනනීය

04 වැනි වගුව **බ්‍රික්ස් සාමාජික රටවල පුනර්ජනනීය බලශක්ති ඉලක්ක ජයගැනීම සඳහා අවශ්‍ය වාර්ෂික ආයෝජන අවශ්‍යතා**

රට	වාර්ෂික ආයෝජන අවශ්‍යතාව (එ.ජ. ඩොලර් බිලියන)	2015 වසරේ පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයේ ආයෝජන (එ.ජ. ඩොලර් බිලියන)	වාර්ෂික ව අවශ්‍ය වන අතිරේක ආයෝජන ප්‍රමාණය (එ.ජ. ඩොලර් බිලියන)	ඉලක්ක වර්ෂය
බ්‍රසීලය	12.1	7.1	5.0	2024
රුසියාව	11.0	1.0	10.0	2020
ඉන්දියාව	26.3	10.2	16.1	2022
චීනය	124.4	102.9	21.5	2020
දකුණු අප්‍රිකාව	3.0	4.5	-1.5	2030
එකතුව	176.8	125.7	51.1	
චීනය හැර	52.4	22.8	29.6	

මූලාශ්‍රය - Institute of Energy Economics and Financial Analysis

බලශක්ති ක්ෂේත්‍රයේ ආයෝජනය කළ යුතු ය. (04 වැනි වගුව) රුසියාවේ පුනර්ජනනීය බලශක්ති ඉලක්ක ජය ගැනීම සඳහා 2016 - 2020 වසරකට එක්සත් ජනපද ඩොලර් බිලියන 11ක් ආයෝජනය කළ යුතු ය. ඉන්දියාව එ.ජ. ඩො. බිලියන 128ක් එනම් වාර්ෂික ව එ.ජ. ඩො. බිලියන 21ක් අලුතින් ආයෝජනය කළ යුතු ය. 2020 වසරේ පුනර්ජනනීය බලශක්ති ඉලක්ක ළඟාකර ගැනීම සඳහා චීනය ආයෝජනය කළ යුතු මුදල එ.ජ. ඩො. බිලියන 622කි. එනම් වාර්ෂික ව එ.ජ. ඩො. බිලියන 124ක් ආයෝජනය කළ යුතු ය. 2030 වන විට දකුණු අප්‍රිකාවේ පුනර්ජනනීය බලශක්ති ඉලක්කය ජයගැනීමට කළ යුතු ආයෝජනය එ.ජ. ඩො. බිලියන 3කි.

බ්‍රික්ස් රටවල් කාණ්ඩය සමස්ථයක් ලෙස ගත් විට පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රවල ආයෝජනය සඳහා වාර්ෂික ව එ. ජ. ඩො. බිලියන 177ක අවශ්‍යතාවක් පවතී. එහෙත් 2015 වසරෙහි එම රටවල පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රවල ආයෝජනය එ.ජ. ඩෝලර් බිලියන 126කි. එනම් ආයෝජන අවශ්‍යතාව හා අයෝජනය අතර එ.ජ. ඩොලර් බිලියන 51 ක රික්තයක් පවතී. චීනය හැර බ්‍රික්ස් සංවිධානයට අයත් අනෙකුත් සාමාජික රටවල පුනර්ජනනීය බලශක්ති ආයෝජන අවශ්‍යතාව එ.ජ. ඩොලර් බිලියන 52කි. කෙසේ වෙතත් 2015 වසරෙහි මෙම රටවල් මෙම අවශ්‍යතාවෙන් සපුරාග ැනීමට සමත් වූයේ අඩකටත් වඩා අඩු ප්‍රමාණයකි. එනම් එ.ජ. ඩොලර් බිලියන 23කි.

පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිවලින් ඔබ්බට...

ලොව මහාමාර්ග ජාලවල විශාලත්වය අතින් ඉන්දියාව දෙවෙනි තැන පසුවෙයි. එහෙත් එරට ඇතැම් ප්‍රාන්තවල මහාමාර්ගවල තත්වය හා ආරක්ෂාකාරී බව සතුටුදායක මට්ටමක නොපවතී. මධ්‍ය ප්‍රදේශය එ වැනි එක් ප්‍රාන්තයකි. ඉන්දියාවේ ප්‍රාන්ත අතුරින් මධ්‍ය ප්‍රදේශය දෙවැනි විශාලතම ප්‍රාන්තයයි. එහි ඒක පුද්ගල ආදායම ජාතික මට්ටමට වඩා සියයට 37කටත් වඩා අඩු මට්ටමක පවතී. නොදියුණු මාර්ග පද්ධතිය ප්‍රාන්තයේ සංවර්ධනය කෙරෙහි බාධාවක් ව පවතී. ඉන්දියාවේ ප්‍රධාන නගර යා කෙරන 200කටත් වඩා වැඩි ප්‍රධාන මාර්ගවලින් මධ්‍ය ප්‍රදේශ් ප්‍රාන්තය හරහා දිවෙන්නේ මාර්ග 21ක් පමණි. ප්‍රාන්තයේ මහාමාර්ගවලින් සියයට 90ක් පමණ තනි මං තීරුවේ හෝ ඊටත් වඩා පළල අඩු මාවත් ය. ප්‍රවාහනය සඳහා ප්‍රමාණවත් යටිතල පහසුකම් නොවීම ප්‍රාන්තයේ ආර්ථික සංවර්ධනය සඳහා බාධාවක්ව පවතී. මේ නිසා මධ්‍ය ප්‍රදේශ් ප්‍රාන්තයේ මාර්ග ජාල සංවර්ධනය කෙරෙහි ඉන්දීය රජය විශේෂ අවධානයක් යොමුකර ඇත. ඒ අනුව 2016 වසරේ ඉන්දියාවේ මධ්‍ය ප්‍රදේශයේ ප්‍රධාන දිස්ත්‍රික් මාර්ග සංවර්ධනය සඳහා නව සංවර්ධන බැංකුව විසින් එරටට එ.ජ.ඩොලර් මිලියන 350ක ණය මුදලක් අනුමත කර ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ කිලෝ මීටර් 1500ක් පමණ මාර්ග සංවර්ධනය කිරීමට සැලසුම්කර ඇත. ඕනෑ ම කාලගුණ තත්ත්වයකට ඔරොත්තු දෙන අයුරින් සහ මාර්ග සංඥා, පදික මාරු හා වෙනත් සියලු ආරක්ෂක විධිවිධාන සහිත ව මධ්‍ය ප්‍රදේශයේ ප්‍රධාන දිස්ත්‍රික්කවල මාර්ග වැඩිදියුණු කිරීමටත් පාලම් හා දුම්රිය මාර්ග ගුවන් පාලම් ඉදිකිරීමටත් සැලසුම්කර ඇත. මධ්‍ය ප්‍රදේශයේ ප්‍රවාහන පහසුකම් වඩාත් විධිමත් හා නවීකරණයවීමත් සමඟ ප්‍රවාහන කාලය සියයට 25කින් අඩුකිරීමට හැකි වේ යැයි ඇස්තමේන්තුකර ඇත. ප්‍රදේශයේ ආර්ථික සංවර්ධනය, අධ්‍යාපනය සහ සෞඛ්‍ය පහසුකම්වල වර්ධනය සඳහා එය හේතු වනු ඇතැයි අපේක්ෂිත ය.

මෙසේ නව සංවර්ධන බැංකුව විසින් 2016 වසර තුළ බ්‍රික්ස් සාමාජික රටවල ව්‍යාපෘති 7 ක් සඳහා එක්සත් ජනපද ඩොලර් බිලියන 1.5 ඉක්ම වූ ණය මුදල් ප්‍රමාණයක් අනුමතකර ඇත. 2016 වසර තුළ අනුමත කරන ලද ව්‍යාපෘති හතෙන් 6ක් ම සූර්ය හා සුළං බල වැනි පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා අනුමත කරන ලද අතර අනෙක් ව්‍යාපෘතිය ණය අනුමත කර ඇත්තේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා ය. පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා ණය ලබාදීම තුළින් නව සංවර්ධන බැංකුව විසින් තිරසර සංවර්ධනය හා හරිත බලශක්තිය කරා යොමුවීම පැහැදිලි වේ.

ආශ්‍රිත ග්‍රන්ථ

1. BRICS 2017 - The Role of BRICS in the World Economy and International Development
2. https://www.ndb.int/
3. New Perspectives on the BRICS Bank - Views from Brazil" India and China on the New Development Bank
4. The New Development Bank Its Role in Achieving BRICS Renewable Energy Targets - Institute for Energy Economics(and Financial Analysis

නීතියයි ඔබයි:

අධිකරණය ඉදිරියේ සාක්ෂිකරුවකු වන ඔබට ඇති අයිතිවාසිකම් සහ හිමිකම්

පවිත්‍රි විතානගේ
ජ්‍යේෂ්ඨ සහකාර අධ්‍යක්ෂ
නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුව

යම් තැනැත්තෙකු විසින් සිදු කරනු ලැබූ වරදකට හෝ මූලික අයිතිවාසිකම් කඩකිරීමකට හෝ මානව හිමිකම් උල්ලංඝනය කිරීමකට අදාළ ව තොරතුරු දන්නා පුද්ගලයෙකු, ඇතැම් විට එකී තොරතුරු නීතිය බලාත්මක කිරීමේ අධිකාරියකට හෝ අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට මැළි වෙන අවස්ථා සමාජයේ අසන්නට ලැබේ. බොහෝ විට එසේ සිදු වන්නේ එම තොරතුරු ලබා දීම හේතුවෙන් එකී පුද්ගලයාට අනාගතයේ දී යම් හානියකට, තර්ජනයකට, බියගැන්වීමකට, පළි ගැනීමකට, මුහුණ දීමට සිදු වේයැයි ඇති වන අනාරක්ෂිත හැඟීම නිසා බව පෙනී යයි. අපරාධයක් පිළිබඳ ව පැමිණිලි නො කිරීම සහ සාක්ෂිකරුවන් ඉදිරිපත් නො වීම යන තත්ත්වයන් යටතේ අපරාධ පරීක්ෂණ සහ නඩුකාරයන් අසාර්ථක විය හැකි අතර රටේ අපරාධ රැල්ලක් ගොඩ නැගිය හැකි ය.

2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත (Assistance to and Protection of Victims of Crime and Witnesses Act, No. 4 of 2015), මෙකී අහිතකර තත්ත්වයන් මග හැරීම උදෙසා, අපරාධයක වින්දිතයන් (Victims) සහ සාක්ෂිකරුවන්ගේ (Witnesses) අයිතිවාසිකම් සහ හිමිකම් දැක්වීම සහ එම අයිතිවාසිකම් සහ හිමිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම, අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා ජාතික අධිකාරියක් පිහිටුවීම, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාසය පිහිටුවීම ඇතුළු ව අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහය සහ ආරක්ෂාව ලබාදීමේ පරමාර්ථ පෙරදැරි කරගෙන සම්මත කරන ලද්දාවූ පනතකි.

රාජකාරි කටයුතු සඳහා ශ්‍රී ලංකා මහ බැංකු නිලධාරීන් හට ඇතැම් අවස්ථාවල දී ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව වැනි නීතිය බලාත්මක කරන ආයතනයකට තොරතුරු සැපයීමට, පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට, හෝ කට උත්තරයක් දීමට හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම වැනි කොමිෂන් සභාවකට හෝ අධිකරණයක් ඉදිරියේ සාක්ෂි ලබා දීමට සිදු විය හැකි ය. මෙම ලිපිය මගින් එවැනි රාජකාරී කරන නිලධාරීන් ඇතුළු ව පොදුවේ එවැනි තත්ත්වයකට මුහුණ පාන ඕනෑ ම සාක්ෂිකරුවකුට පනතේ ප්‍රතිපාදන අනුව හිමි වන සහය සහ ආරක්ෂාව සම්බන්ධ ව කෙටි හැඳින්වීමක් ලබා දීමට අපේක්ෂා කෙරේ.

2. සාක්ෂිකරුවකු යනු කවරකු ද?

මෙම පනතේ 'සාක්ෂිකරුවකු' යන්න ඉතා පුළුල් වශයෙන් අර්ථ දක්වා ඇත. යම් පුද්ගලයෙකු,

- නීතිය බලාත්මක කිරීමේ නිලධරයෙකු වෙත තොරතුරු සපයා හෝ පැමිණිල්ලක් කර එකී තොරතුර හෝ පැමිණිල්ල පදනම් කර ගෙන විමර්ශනයක් ආරම්භ කර ඇත්තේ නම් හෝ,

- දැනට ආරම්භ කර ඇති විමර්ශනයකට තොරතුරු සැපයීමක් හෝ ප්‍රකාශයක් ලබා දී ඇත්නම් හෝ,
- අපරාධ වින්දිතයෙකු විසින් කර ඇති පැමිණිල්ලකට හෝ පවරා ඇති නඩුවකට සහය වීමට දිවුරුම් පෙත්සමක් හෝ ප්‍රකාශයක් ලබා දී ඇත්නම් හෝ,
- කොමිෂන් සභාවකට තොරතුරු හෝ නිවේදනයන් සපයා ඇත්නම් හෝ,
- නීතිය බලාත්මක කිරීමේ නිලධරයෙකු වෙත ලබා දෙන ලද තොරතුරු හෝ ප්‍රකාශ මත අධිකරණයක් හෝ කොමිෂන් සභාවකට සාක්ෂි ලබා දීමට තමන් ව කැඳවන බවට විශ්වාස කරන්නේ නම් හෝ
- අධිකරණයෙන් හෝ කොමිෂන් සභාවකින් සිතාසි ලැබුවේ නම්,

එකී පුද්ගලයා 'සාක්ෂිකරුවකු' ලෙස අර්ථ දක්වා ඇත.

යම් වරදක් සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කර ඇති රජයේ නිලධාරියෙකු ද සාක්ෂිකරුවකු යටතට ඇතුළත් වේ.

එසේ ම වැඩිදුරටත් සාක්ෂිකරු යන නිර්වචනයට අපරාධ වින්දිතයෙකු, ළමා සාකෂිකරුවකු, ළමා සාක්ෂිකරුවකුගේ මව්පියන් හෝ භාරකරුවන් හෝ එවැනි සාක්ෂිකරුවකුගේ පවුලේ සාමාජිකයෙක් හෝ යැපෙන්නෙක් හෝ ඒ තැනැත්තාට සුවිශේෂී වැදගත්කමක් ඇති වෙනත් යම් තැනැත්තෙකු, විශේෂඥ සාක්ෂිකරුවකු සහ යම් වරදකට සැක කරන හෝ චෝදනාවකට ලක් වූ අයෙකු වෙනුවෙන් සාක්ෂියට කැඳවනු ලැබූ අයෙකු ද අදහස් වේ.

3. සාක්ෂිකරුවකුගේ අයිතිවාසිකම්

(1) පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම

නීතිය බලාත්මක කරන ආයතනයකට තොරතුරු සපයන අවස්ථාවක දී, පැමිණිල්ලක් ඉදිරිපත් කරන අවස්ථාවක දී හෝ කට උත්තරයක් ලබා දෙන අවස්ථාවක දී හෝ කොමිෂන් සභාවකට හෝ අධිකරණයක් ඉදිරියේ සාක්ෂි ලබා දෙන අවස්ථාවක දී, සාක්ෂිකරුගේ ගෞරවය රැකෙනා ලෙසට සහ සිය පුද්ගලිකත්වයට හානි නො වන ලෙසට විමර්ශන, අර්ධ අධිකරණ හෝ අධිකරණ බලධරයන්ගෙන් සැලකුම් ලැබීමට සාක්ෂිකරුවකු හට හිමිකමක් ඇති බවට පනතේ 5 වන වගන්තියේ සඳහන් කර ඇත.

(2) හිරිහැරයකට, බිය ගැන්වීමකට, බල කිරීමකට, හෝ බිඳවීමකට භාජනය නො වීම

යම් සාක්ෂිකරුවකු, තොරතුරු ලබා දීම, විමර්ශනයක හෝ පරීක්ෂණයක දී ස්වෙච්ඡා ප්‍රකාශයක් කිරීම, හෝ අධිකරණය හෝ කොමිෂන් සභාවක් ඉදිරියේ සාක්ෂි ලබා දීම හේතුවෙන් එකී සාක්ෂිකරු කවර හෝ ආකාරයේ හිරිහැරයකට, බිය ගැන්වීමකට, බල කිරීමකට, හෝ බිඳ වීමකට පත් නො විය යුතු බවට පනතේ 5 වන වගන්තියේ සඳහන් කර ඇත.

(3) ආරක්ෂාව ලබා ගැනීම

තොරතුරු ලබා දීම, කට උත්තරයක් දීම, හෝ පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම, විමර්ශනයක හෝ පරීක්ෂණයක දී ස්වෙච්ඡා ප්‍රකාශයක් කිරීම, හෝ අධිකරණය හෝ කොමිෂන් සභාවක් ඉදිරියේ නඩුකරයක් පැවරීම හෝ සාක්ෂි ලබා දීම හේතුවෙන් එකී සාක්ෂිකරු කවර හෝ ආකාරයේ හිරිහැරයකට, බිය ගැන්වීමකට, බල කිරීමකට, හෝ බිඳවීමකට පත් කිරීමට එරෙහි ව එකී සාක්ෂිකරුට ආරක්ෂාව ලබා ගැනීමට හිමිකමක් ඇති බව ද නීතියේ සඳහන් කර ඇත. එසේ ම, පාදක වන වරද හෝ මූලික අයිතිවාසිකම් කඩවීම එකී සාක්ෂිකරුගේ සේවා ස්ථානයේ හෝ සේවා වටපිටාවේ දී සිදු වූවක් නම් ඔහුට මානසික ව, කායික ව හෝ කීර්තිනාමයට හානියක් හෝ අලාභයක් සිදු වීමට හේතු වන්නා වූ යම් හිරිහැරයකට, බිය ගැන්වීමකට, බලකිරීමකට හෝ බිඳ වීමකට හෝ, ඔහුගේ රැකියාවේ ඇති වන අහිතකර වෙනස්වීමකට එරෙහි ව ද එකී සාක්ෂිකරුට ආරක්ෂාව ලබා ගැනීමට හිමිකමක් ඇත.

4. සාක්ෂිකරුවකුට එරෙහි ව සිදුකරන වැරදි සහ ඒ හා ඊට අදාළ දඬුවම්

4.1 තර්ජනය කිරීම

පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම වැළැක්වීම, හෝ සාක්ෂි ලබාදීම වැළැක්වීම හෝ පැමිණිල්ල හෝ පවරා ඇති නඩුකරයක් ඉල්ලා අස් කර ගැනීමේ අරමුණින්, එකී සාක්ෂිකරුගේ ශරීරයට කීර්තිනාමයට හෝ දේපළවලට හානියක් සිදු කර තර්ජනය කිරීම මගින් වරදක් කරන්නා වූ පුද්ගලයෙකුට මහාධිකරණය විසින් අවුරුදු 10කට නො වැඩි බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් සහ රුපියල් විසි දහසක දඩයක් පැනවිය හැකි ය (මෙය එකී සාක්ෂිකරුට සම්බනධයක් ඇති වෙනත් තැනැත්තෙකුගේ ශරීරයට කීර්තිනාමයට හෝ

දේපළවලට හානියක් සිදුකර තර්ජනය කිරීමට ද අදාළ වේ).

4.2 ප්‍රතිහිංසා කිරීම

i. එකී සාක්ෂිකරුට තුවාල සිදු කිරීමක් මගින් වරදක් කරන්නාවූ පුද්ගලයෙකුට මහාධිකරණය විසින් අවුරුදු 10කට නො වැඩි බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් සහ රුපියල් විසි දහසක දඩයක් පැනවිය හැකි ය.

ii. එකී සාක්ෂිකරුට බරපතල තුවාල සිදු කිරීම හෝ අයුතු අවහිරයක් සිදුකිරීම මගින් වරදක් කරන්නාවූ පුද්ගලයෙකුට මහාධිකරණය විසින් අවුරුදු 12කට නො වැඩි බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් සහ රුපියල් තිස් දහසක දඩයක් පැනවිය හැකි ය.

iii. එකී සාක්ෂිකරුව යම් ස්ථානයකින් පිට කිරීම සඳහා, බල කිරීමකින් හෝ වංචා සහගත උපක්‍රම මගින් බලය අනිසි ලෙස යෙදීමෙන් හෝ වෙනත් යම් බල කිරීමකින් පොළඹවා ගැනීමෙන් වරදක් කරන්නා වූ පුද්ගලයෙකුට මහාධිකරණය විසින් අවුරුදු 12කට නො වැඩි බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් සහ රුපියල් තිස් දහසක දඩයක් පැනවිය හැකි ය.

iv. එකී සාක්ෂිකරුගේ දේපළවලට අයුතු සහගත පාඩුවක්, අලාභයක් හෝ විනාශයක් සිදු කිරීමට අදහස් කිරීමෙන් හෝ සිදු කිරීමෙන් වරදක් කරන්නා වූ පුද්ගලයෙකුට මහාධිකරණය විසින් අවුරුදු 12 කට නො වැඩි බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් සහ රුපියල් තිස් දහසක දඩයක් පැනවිය හැකි ය.

4.2 හිරිහැරයක්, බිය ගැන්වීමක්, බල කිරීමක්, හෝ බිඳවීමක්, හෝ කායික සහ මානසික වේදනාවක් හෝ ඔහුගේ කීර්තියට හානියක් හෝ අලාභයක් කරන හෝ එකී සාක්ෂිකරුගේ සේවා ස්ථානයේ සේවා තත්ත්වයට අහිතකර වෙනස්කමක් සිදු කිරීම

මහාධිකරණය විසින් අවුරුදු 7කට නොවැඩි බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් සහ රුපියල් පහළොස් දහසක දඩයක් පැනවිය හැකි ය.

4.3 සාක්ෂිකරුවකු විසින් ලබාදෙන ලද්දාවූ තොරතුරු හෝ ඔහුගේ අනන්‍යතාව තුන්වන පාර්ශ්වයකට හෙළි කර ජීවිතය අනතුරට ලක් කිරීම

සද්භාවයෙන්, නීත්‍යානුකූල විධිවිධාන හෝ ක්‍රියා පටිපාටි හෝ නියම හෝ විධානවලට අනුකූල වීමක දී හැර යම් සාක්ෂිකරුවකු විසින් ලබා දෙන ලද්දාවූ තොරතුරු හෝ ඔහුගේ අනන්‍යතාව තුන්වන පාර්ශ්වයකට හෙළි කර ජීවිතය අනතුරට ලක් කරන යම් තැනැත්තෙකුට මහාධිකරණය විසින් අවුරුදු 7කට නො වැඩි බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් සහ රුපියල් පහළොස් දහසක දඩයක් පැනවිය හැකි ය. මෙකී දඬුවම යම් සාක්ෂිකරුවකුගේ ආරක්ෂාව සම්බන්ධ තොරතුරු ලබා දීම මගින් ජීවිතය අනතුරට ලක් කරන යම් තැනැත්තෙකුට ද අදාළ වේ.

4.4 සාක්ෂිකරුවකුට අල්ලසක් ප්‍රදානය කිරීම

නඩුකරයක් පැවරීම, සත්‍ය තොරතුරු සැපයීම හෝ සාක්ෂි ලබා දීම වැළැක්වීම, අධෛර්යයට පත් කිරීම හෝ අවහිර කිරීමේ අරමුණින් අල්ලසක් ප්‍රදානය කිරීම, සැපයීම හෝ ලබා දීම සිදු කරන තැනැත්තාට මහාධිකරණය විසින් අවුරුදු 7කට නො වැඩි බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් සහ රුපියල් පහළොස් දහසක දඩයක් පැනවිය හැකි ය.

මෙම වැරදි සිදු කිරීමට තැත් කිරීම, පෙළඹවීම, චේතනාන්විත ව සහය වීම සහ කුමන්ත්‍රණය කිරීම යන වැරදි සඳහා ද අදාළ වරද සිදු කළ පුද්ගලයෙකුට පනවන දඬුවම ම අදාළ වේ.

මෙම වැරදි සිදු කරන පුද්ගලයෙකු වරෙන්තුවකින් තොර ව අත්අඩංගුවට ගැනීමට හැකි අතර ඔහුට ඇප ලබා ගත හැකි වනුයේ අභියාචනාධිකරණයෙන් පමණි.

නීතියේ ආධිපත්‍යය පවතින රටක අපරාධ සිදු වීම අඩු කිරීම උදෙසා පොලීසිය වැනි නීතිය බලාත්මක කරන ආයතනයක් ඉදිරියේ හෝ අධිකරණය ඉදිරිපිට නඩු කටයුත්තක දී හෝ සාක්ෂිකරුවකුට බියෙන් තොර ව සාක්ෂි ලබා දීමට උපකාරී වන එසේ ම ඔවුන්ට නීතිය මගින් රැකවරණය සලසන වට පිටාවක් උදාකරලීම මෙම පනතින් අපේක්ෂා කරන ලද බව එහි අඩංගු ප්‍රතිපාදනවලින් පැහැදිලි වේ.■

මුදල් විශුද්ධිකරණය සිදුවන්නේ මූල්‍ය ආයතන හරහා පමණක් නොවේ

තේජා පත්බේරිය
ජ්‍යේෂ්ඨ සහකාර අධ්‍යක්ෂ
මූල්‍ය බුද්ධි ඒකකය

1 හැඳින්වීම:

පොදු පිළිගැනීමක් ඇති, හුවමාරු මාධ්‍යයක් ලෙස ක්‍රියා කරන, ගෙවීම් කටයුතු සඳහා පොදුවේ භාවිත වන මුදල්, ඕනෑ ම රටක දී නිකුත් කිරීමේ හැකියාව ඇත්තේ ඒ සඳහා බලයලත් අධිකාරියකට පමණි. එසේ නිකුත් කරන ලද මුදල් ඉපයීමේ දී මෙන් ම ගනුදෙනු සඳහා භාවිත කිරීමේ දී ද එය පොදුවේ පිළිගනු ලබන නීති රාමුවක් තුළ සිදු කලයුතු ව ඇත. සරල ව සඳහන් කළහොත්, අයථා ආකාරවලින් මුදල් ඉපැයීම මෙන් ම අයථා කටයුතු සඳහා මුදල් වියදම් කිරීම ද නීති විරෝධී ලෙස සලකනු ලබයි. එය එසේ වුවද, බොහෝ රටවල විධිමත් නෛතික ආර්ථික රාමුවෙන් පිටත සිදුවන අයථා ආර්ථික ගනුදෙනු ද අඩු වැඩි වශයෙන් සිදුවෙනවා නො අනුමාන ය. මෙ වන් නීති විරෝධී ආර්ථික ගනුදෙනුවලින් ඕනෑ ම රටක විධිමත්, නෛතික ආර්ථික කටයුතු කෙරෙහි එල්ල වන්නේ අහිතකර බලපෑමකි. එබැවින්, එ වැනි අයථා ආර්ථික ගනුදෙනු වැළැක්වීම සඳහා ලොව පුරා රටවල විවිධ නීති සහ රෙගුලාසි ක්‍රියාත්මක ව පවතී.

ගෝලීයකරණය හරහා අයථා අන්දමින් ඉපැයූ මුදල්වල සහ එ වැනි ගනුදෙනුවල අහිතකර බලපෑම සෙසු රටවලට ද ව්‍යාප්ත වීමේ දැඩි අවදානමක් පවතී. එ බැවින්, එ වැනි ගනුදෙනු වැළැක්වීමට ලෝක සම්මත නිර්දේශයන් තදින් ම ක්‍රියාත්මක වෙයි. මෙ වන් තත්ත්වයක් තුළ කිසියම් පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් යම් නීති විරෝධී ආකාරයකින් මුදල් උත්පාදනය කරනු ලබයි ද, එ ලෙස උපයාගත් අයථා ධනය විධිමත් ආර්ථික රාමුව තුළ වැය කිරීම් සඳහා උත්සාහ දරයි ද, එ සේ කිරීමේ දී මුදල් උපයා ගනු ලැබූ අයථා ආකාරය නොහොත් නීති විරෝධී මූලාශ්‍රය සඟවා තබා ගත යුතුම වෙයි.

1.1 මුදල් විශුද්ධිකරණය

මෙ ලෙස නෛතික නොවන අයුරින් මුදල් උපයා ගනු ලබන මූලාශ්‍ර අතර, නීති විරෝධී ලෙස සිදුකරන මත්ද්‍රව්‍ය වෙළෙඳාම, අවි ආයුධ වෙළෙඳාම, සත්ත්ව සහ මිනිස් වෙළඳාම, ජෛව කොටස් ජාවාරම, ගණිකා වෘත්තියෙහි යෙදීම, සංවිධානාත්මක ව සිදු කරන අපරාධ, හොර බඩු ජාවාරම සහ රජයට ගෙවිය යුතු බදු මුදල් නොගෙවා පැහැර හැරීම ආදිය ප්‍රමුඛස්ථානයෙහි පවතී. මෙ වැනි නෛතික නො වන මාර්ගවලින් උපයාගත් මුදල් විවිධ අරමුණු සඳහා යෙදවීමේ දී ඒවා පිළිගත් නෛතික ආර්ථික රාමුව තුළට ඇතුළත් කිරීම අත්‍යවශ්‍ය වෙයි. ඒ සඳහා මුදල් උපයා ගනු ලැබූ නෛතික නොවන මූලාශ්‍රය සඟවා තබා ගනිමින් නෛතික ව උත්පාදනය කර ගනු ලැබූ මුදල් සමග එ කී මුදල් මුසු කිරීමේ දී එය ඉතා සූක්ෂ්ම අයුරින් කළ යුතු ව ඇත. මන්ද යත්, එ සේ සිදු කිරීම නීති විරෝධී ක්‍රියාවක් බැවිනි.

මෙලෙස "නෛතික නො වන ආකාරයන්ගෙන් ඉපැයූ මුදල් නීත්‍යානුකූල ආර්ථික ගනුදෙනුවලින් ඉපැයූ මුදල් සමග මුසු කිරීමේ අරමුණින් ඒවායෙහි අයථා උත්පාදන මූලාශ්‍රය සඟවා තබමින්, නීත්‍යානුකූල භාවයක් ආරෝපණය කිරීමේ ක්‍රියාවලිය මුදල් විශුද්ධිකරණය" ලෙස හැඳුන්වනු ලැබේ. ඒ අනුව, කිසියම් රටක පවත්නා නීති රෙගුලාසි ප්‍රකාර ව නීති විරෝධී යයි නම්කරන ලද කටයුතුවල නිරත වීමෙන් මුදල් උපයා ගැනීම, එකී මුදල් උත්පාදන මාර්ගය වසන් කොට නීත්‍යානුකූල ආර්ථික කටයුතුවලට යෙදවීම සහ එමඟින් එකී මුදල් හෝ අයථා ලෙස රැස් කරගත් ධනය සඳහා නීත්‍යානුකූල භාවයක් ආරෝපණය කිරීම සහ පසුව එකී මුදල් හෝ රැස් කරගන්නා ලද ධනයක් ස්වකීය සුඛ විහරණයට හෝ වෙනත් වූ නීති විරෝධී ක්‍රියා තර කිරීමට හෝ සාපරාධී ක්‍රියාවන්හි නියැලීමට හෝ නැතහොත් ත්‍රස්තවාදී කණ්ඩායම් නඩත්තු කිරීමට යොදා ගැනීමේ ක්‍රියාවලිය මුදල් විශුද්ධිකරණය ලෙස හඳුනා ගනු ලබයි. මෙම ක්‍රියාවලිය සිද්ධාන්ත වශයෙන් පහත පරිදි ප්‍රධාන අදියර තුනක් යටතේ දක්වනු ලබයි. ඉහත සටහනේ දැක්වෙන අදියර 1 අවස්ථාවේ දී,

සටහන 1:

ස්ථාපනය කිරීම (Placement) → **විවිධ අංශවලට බෙදා දැක්වීම (Layering)** → **සංකලනය කිරීම (Integration)**

අදියර 1 | අදියර 2 | අදියර 3

නීති විරෝධී ලෙස උපයා ගනු ලැබූ මුදල් නීත්‍යානුකූල ආර්ථික කටයුතුවල නියුතු ආයතන හරහා විධිමත් ආර්ථික රාමුව තුළට ස්ථාපනය කිරීම සිදු කරනු ලබයි. බොහෝ විට මෙම ක්‍රියාව සිදු කරනු ලබන්නේ මූල්‍ය ආයතන, විශේෂයෙන් ම වාණිජ බැංකු හරහා ය. එ සේ ම, මූල්‍ය නො වන ආයතන ද මේ සඳහා අවභාවිත කිරීමේ ඉහළ හැකියාවක් පවතී.

අදියර 2 අවස්ථාවේ දී එ ලෙස ස්ථාපනය කරනු ලැබූ මුදල් විවිධ ගිණුම්වලට මාරු කර හැරීම සිදු කරනු ලබයි. මෙය ඉතා ම සංකීර්ණ ක්‍රියාවක් වන අතර මෙ මගින් මුදල් උත්පාදනයේ පැවති අයථා ස්වභාවය තවදුරටත් සඟවා තබා ගනිමින් ගනුදෙනුවෙහි අග මුල අනාවරණය කර ගත නො හැකි ලෙසට නා නා කොටස්වලින් යුතු සම්මිශ්‍රිත ස්වභාවයක් ගනුදෙනුව තුළට පමුණුවනු ලබයි. මෙහිදී මුදල් දේශීය මෙන්ම විදේශීය බැංකුවල පුද්ගල ගිණුම් තුළට මාරුකර යැවීම, එලෙස මාරු කර යැවීමේදී මුදල් ප්‍රමාණ කුඩා ඒකකවලට වෙන් කිරීම වැනි ක්‍රියාවන් සිදු කරනු ලබයි. බොහෝ දුරට විද්‍යුත් මුදල් හුවමාරු ක්‍රම මේ සඳහා භාවිතා කරනු ලබයි.

අදියර 3 යටතේ මෙම මුදල් නෛතික ආර්ථික කටයුතු සමග සම්මිශ්‍රණය කිරීම සිදු කරනු ලබයි. එහි දී, එම මුදල් භාවිතා කර විවිධ සුඛෝපභෝගී භාණ්ඩ මිලදී ගැනීම, නිවාස හා ඉඩකඩම් මිලදී ගැනීම සහ විවිධ ආයෝජනයන් සිදු කිරීම, නිදසුනක් ලෙස රාත්‍රී සමාජ ශාලා පවත්වාගෙන යෑම, ආහාර වෙළෙඳසැල්, හෝටල් වැනි ව්‍යාපාරයන්හි ආයෝජනය කිරීම ද සිදු කරනු ලබයි. මෙ ලෙස සිදු කරනු ලබන ආයෝජනයන් ආර්ථික ලාභ අපේක්ෂාවෙන් සිදු නොකරන අතර හුදෙක් ම අයථා උත්පාදන මූලාශ්‍රය සඟවා තබා ගැනීමට හා මුදල් අවශ්‍ය වූ විට එය රැගෙන ව්‍යාපාරයෙන් ඉවත්ව යාමේ කූට අරමුණ ඇති ව සිදු කරනු ලබයි. එ බැවින්, මෙ වැනි ආයෝජනයන්ගෙන් සමාජයට අත්වන්නේ හානියක් මිස අර්ථලාභයක් නම් නොවේ. මෙම අවස්ථාව වන විට මුදල් උත්පාදනයෙහි වංචනික ස්වභාවය බොහෝ දුරට යටපත් කරලීමට මුදල් විශුද්ධිකරණයෙහි නියැළෙන්නන්ට හැකියාව පවතී.

1.2 මුදල් විශුද්ධිකරණය සහ එ මගින් ආර්ථික කටයුතු කෙරෙහි වන බලපෑම

මුදල් විශුද්ධිකරණය රටක ආර්ථික කටයුතු කෙරෙහි අහිතකර ලෙස බලපායි. මෙහි ඇති අවදානම වන්නේ මුදල් විශුද්ධිකරණයෙහි නියැළෙන්නන් මෙලෙස ආයෝජනය සිදු කරන්නේ හෝ නිවාස ඉඩකඩම් මිලදී ගන්නේ ආර්ථික ලාභ හිමිකර ගැනීමට හෝ පදිංචිය සඳහා නො වීමයි. ඔවුන් නොබෝ දිනකින් ම මෙම නිවාස ඉඩකඩම් විකුණා දමා සිය අයථා අයුරින් උත්පාදිත මුදල් නැවත හිමිකර ගනී. එම මුදල් සිය වංචාකාරී ක්‍රියා තවදුරටත් තර කර ගැනීම හෝ ත්‍රස්තවාදය පෝෂණය කිරීම වැනි අහිතකර ක්‍රියා සඳහා යොදා ගැනීමේ හැකියාව ද ඉතා ඉහළ ය. මැණික් හා ස්වර්ණාභරණ වැනි මිල අධික භාණ්ඩ මිලදී ගැනීම ද මෙ වැනි පුද්ගලයන් විසින් මෙ ලෙස ම යටි අරමුණු ඇති ව සිදු කරනු ලබයි. මෙහි අනිටු ආර්ථික ප්‍රතිඵලයක් ලෙස අනවශ්‍ය පරිදි, නිසි ආර්ථිකමය හේතුවක් නොමැති ව එ කී භාණ්ඩවල මිල ඉහළ යෑම තුළින් එම භාණ්ඩවල වෙළෙඳපොළ අගයයන් ඉතා ඉහළ මට්ටමකට පැමිණීම දැක්විය හැකි ය. මෙ වැනි සිද්ධීන් මගින් එකී ආර්ථිකයන්හි සුමට ක්‍රියාකාරිත්වයට බාධා පැමිණෙනු ඇත. මෙ වැනි ක්‍රියා හේතුවෙන් වෙළෙඳපොළ ගැනුම් විකුණුම් ක්‍රියාවලිය මත තීරණය වන මිල ගණන් වෙනුවට කෘතිම මිළ යාන්ත්‍රණයන් ඇතිවීම වළකාලිය නො හැකි ය. එ සේ ම, වංචාකාරි සහ සාපරාධී ක්‍රියා තව තවත් තරවීම මගින් නෛතික ආර්ථික රාමුව බිඳ වැටී විවිධ වූ සාමාජීය, ආර්ථික සහ දේශපාලන ගැටලු රාශියක් කරා ආර්ථිකයන් යොමු කිරලීමේ අවදානම ද ඉහළ මට්ටමක පවතී.

1.3 මූල්‍ය ව්‍යාපාර මාර්ගයෙන් සිදුවන මුදල් විශුද්ධිකරණය සහ එයට විරුද්ධ ව ක්‍රියාත්මක වන ගෝලීය එකඟතාවන්

(අ) මුදල් විශුද්ධිකරණය සඳහා බැංකු සහ මූල්‍ය ආයතන යොදා ගැනීම:

අතීතයේ පටන් මුදල් විශුද්ධිකරණය සඳහා භාවිත කළ ප්‍රධාන ම මාර්ගයක් ලෙස මූල්‍ය ව්‍යාපාර ප්‍රචලිත ව පවතී. බැංකු සහ බැංකු නොවන අනෙකුත් මූල්‍ය ආයතන හරහා අයථා අයුරින් උපයන ලද ධනය සඳහා නීතිමය ස්වභාවයක් ආරෝපණය කර දීම සුළභ ව සිදු කෙරුණු බව ප්‍රචලිත කරුණකි. නිදසුනක් වශයෙන් මෙක්සිකානු සහ කොලොම්බියානු මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් ලොව සුපතල වාණිජ බැංකුවක් හරහා නීති විරෝධි මත්ද්‍රව්‍ය වෙළෙඳාමෙන් ඉපැයූ අති විශාල මුදල් ප්‍රමාණයක්, දළ වශයෙන් ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 881ක් පමණ මුදලක් නීත්‍යානුකූල ව ඉපැයූ මුදල් ලෙස මවා පාමින් බැංකු පද්ධතිය තුළට ස්ථාපනය කිරීම දැක්විය හැකි ය. මෙම අයථා කටයුතු සඳහා තම බැංකු ව්‍යාපාරය භාවිත කිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් වූ විචක්ෂණශීලී වැඩපිළිවෙළක් එම බැංකුව තුළ එවකට ක්‍රියාත්මක නොවූ බැවින් මෙම මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට නීති විරෝධි මත්ද්‍රව්‍ය වෙළෙඳාමෙන් ඉපැයූ මුදල් සඳහා නෛතික භාවයක් ආරෝපණය කිරීමෙහි ලා මෙම බැංකු ආයතනය තෝතැන්නක් බඳු විය. මේ බැව් අනාවරණ වීමෙන් පසු වසර 2012 දී ඇමරිකා එක්සත් ජනපද නීති බලධාරීන් විසින් මෙම වාණිජ බැංකුවට ඩොලර් බිලියන 1.9ක මුදල්මය දඩයක් නියම කළ අතර, අයථා අයුරින් උත්පාදිත විශුද්ධිකරණය මුදල් කිරීම වැළැක්වීමට අවශ්‍ය ලොව පිළිගත් නීති රෙගුලාසි අනුව ක්‍රියාත්මක වීමට අවශ්‍ය අභ්‍යන්තර ක්‍රියාමර්ග වහා ම ක්‍රියාත්මක කරන ලෙසට උසාවි නියෝග ද පනවන ලදි. (මූලාශ්‍රය: Seven Pillars Institute for Global Finance and Ethics)

(ආ) මූල්‍ය කාර්ය සාධක බලකාය:

ගෝලීයකරණයත්, තාක්ෂණයේ වූ පිබිදීමත් සමග මෙම අයථා අයුරින් උත්පාදිත මුදල් මෙලෙස මූල්‍ය ආයතන හරහා විශුද්ධිකරණය වනවා පමණක් නොව, ලොව විවිධ රටවලට එමලගින් සිදුවන හානිය ද ඉහළ යෑමට පටන් ගන්නා ලදි. මුදල් විශුද්ධිකරණය මූල්‍ය ආයතන හරහා බහුල ව සිදුවන බවට වූ සාක්ෂි සහ තහවුරු වීම් සහ එමගින් සිදුවන ආර්ථිකමය සහ සමාජමය හානිය පිළිබඳවත්, සලකා බැලූ ලෝක ප්‍රජාව එයට විරුද්ධ ව ගෝලීය එකඟතාවෙන් යුතු ව ක්‍රියා කරනු වස් වසර 1989 දී ජී-7 කණ්ඩායමේ රටවල්වල මූලිකත්වයෙන් ක්‍රමවත් වැඩ පිළිවෙළ ආරම්භ කෙරිණි. පසුකාලීන ව ලොව පුරා මෙම වැඩ පිළිවෙළ ව්‍යාප්ත වීමත් සමගම එම කර්තව්‍යයෙහි මූලිකත්වය ගෙන ක්‍රියා කරනු වස් ලොව පුරා මුදල් විශුද්ධිකරණය පිළිබඳ ප්‍රමිති නිර්ණය කරනු ලබන අන්තර් රාජ්‍යයන්ගෙන් සැදුම්ලත් සංවිධානයක් ලෙසට මූල්‍ය කාර්ය සාධක බලකාය (Financial Action Task Force -FATF) පිහිටුවා ගන්නා ලදි. මෙහි නිර්ණායකයන් ලොව පුරා ව්‍යාප්තවීමත් සමග ජාවාරම්කරුවන්ට සිය අයථා කටයුතුවලින් උපයනු ලබන මුදල් යම් යම් ආයතන එනම් මූල්‍ය බැංකු සහ බැංකු නොවන අනෙකුත් මූල්‍ය ආයතන හරහා විශුද්ධිකරණය කර ගැනීමේ අවස්ථාවන්ට සීමා පැනවිණි. මේ හේතුවෙන් මුදල් විශුද්ධිකරණය සිදුකිරීම සඳහා නව මං සොයන්නට මුදල් විශුද්ධිකරණයේ නියැළෙන්නන්ට සිදු විය. ඒ අනුව, ඔවුන්ගේ සූක්ෂ්ම ඇස් නිතැතින් යොමු වන්නේ මූල්‍ය නොවන ව්‍යාපාර අංශය වෙතයි.

2. මූල්‍ය නොවන ව්‍යාපාර හා වෘත්තීමය සේවා සපයන ආයතන හරහා සිදුවන මුදල් විශුද්ධිකරණය:

ඕනෑ ම ආර්ථිකයක මූල්‍ය නොවන ව්‍යාපාර අංශය ඉතා පුළුල් වපසරියකින් හෙබි, විධිමත් සේ ම අවිධිමත් ව්‍යාපාර අංශ ගණනාවකින් සැදුම්ලත්, බොහෝවිට නීති රෙගුලාසි රාමුවකට එක් ව ගෙන ක්‍රියා කිරීමට අසීරු, එකිනෙකට වෙනස් ව්‍යාපාර රාශියකින් සමන්විත වෙයි. මෙම මූල්‍ය නොවන ව්‍යාපාර අංශ අධීක්ෂණය කරනු ලබන ආයතනික ව්‍යුහයක් නොමැතිවීම ද, ව්‍යාපාර බලපත්‍ර නිකුත් කිරීමේ නෛතික අවශ්‍යතාවක් නොමැති වීම ද බොහෝ රටවල මෙම ව්‍යාපාර අංශයෙහි පොදු ලක්ෂණයක්ව පවතී. මෙ වැනි හේතු නිසාවෙන් මූල්‍ය ව්‍යාපාර අංශයන්ට පනවා ඇති මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සඳහා වන ලෝක නියාමනයන් නිසියාකාර ව මූල්‍ය නොවන ව්‍යාපාර අංශය සඳහා ක්‍රියාත්මක කිරීමේ ප්‍රායෝගික අපහසුතාවන් රැසකට ලොව පුරා ඒ පිළිබඳව ක්‍රියාත්මක වන ආයතන මේ වන විට මුහුණ පා සිටියි. ලොව පුරා සිදුකෙරෙන මුදල් විශුද්ධිකරණ සිදුවීම් දෙස බලන කළ පෙනී යන්නේ මුදල් විශුද්ධිකරණයෙහි නියැලෙන්නන්ගේ තීක්ෂ්ණ අවධානයට නතු වූ ප්‍රධාන ම මූල්‍ය නොවන ව්‍යාපාර අංශ අතර නිශ්චල දේපළ වෙළෙඳාම, මැණික් සහ ස්වර්ණාභරණ ඇතුළු අනෙකුත් ඉහළ වටිනාකමක්

ඇති ලෝහ සහ ගල් වෙළෙඳාම, සූදු සහ කැසිනෝ ව්‍යාපාර මෙන් ම ගණකාධිකාරීවරුන්, නීතිවේදීන් සහ නොතාරිස්වරුන් හරහා කරනු ලබන වෘත්තීයමය ගනුදෙනු ද, භාරකාර සමාගම්වල සහ ආයතනික සේවා සපයන්නන් විසින් සිදු කරනු ලබන වෘත්තීයමය සේවාවන් ද ඉදිරියෙන්ම පවතින බව ය. මෙ වැනි ව්‍යාපාරයන් හා වෘත්තීය සේවාවන් සපයන ආයතන භාවිත කරමින් (ආයතනික දැනුම්වත් බවින් තොර ව හෝ දැනුම්වත් බවින් යුතු ව) මුදල් විශුද්ධිකරණය සිදුකරන ආකාරය මීළඟට සලකා බලමු.

2.1 නිශ්චල දේපළ ව්‍යාපාර ගනුදෙනු හරහා සිදු කරන මුදල් විශුද්ධිකරණය

දේපළ වෙළෙඳාමේ ගනුදෙනු මුදල් විශුද්ධිකරණය සඳහා අවභාවිත කරන අයුරු මෙ ලෙස නිදසුනක් මඟින් පැහැදිලි කර ගත හැකි ය. මත්ද්‍රව්‍ය ජාවාරමේ නියැලෙන්නෙකුට එ මගින් උපයාගත් රුපියල් මිලියන සියයක මුදලක් උපයා ගනු ලැබූ ආකාරය නැතහොත් මූලාශ්‍රය සඟවා තබමින් නිශ්චල දේපළක් මිලදී ගැනීම සඳහා භාවිත කිරීමේ හැකියාවක් පවතී. මෙසේ නිශ්චල දේපළ මිලට ගැනීමේ දී එ කී දේපළ තම නමට පවරා ගැනීමක් බොහෝවිට මොවුන් සිදු නො කිරීමට වග බලා ගනිති. එ වැනි අවස්ථාවල ඔවුන් ඉතා සූක්ෂ්ම උපායමාර්ග අනුගමනය කරනු ලබන බව නිදර්ශනයන් මඟින් මෙ ලෙස පැහැදිලි කරගත හැකි ය. බෙල්ජියම් නීති අධිකාරීන් විසින් කරන ලද විමර්ශනයකින් පෙනී ගොස් ඇත්තේ එම රටෙහි වංචනික පුද්ගලයකු දේපළ මිලදී ගැනීම සඳහා නොතාරිස්වරයෙකුගේ සේවාදායක ගිණුම් භාවිත කර ඇති බවයි. මේ සඳහා ඔහු වෙළෙඳ සමාගමක් ස්ථාපිත කර ඇති අතර විමර්ශනවලින් හෙළි වී ඇති ආකාරයට එම වෙළෙඳ සමාගමෙහි එක ම කොටස්කරු ද වන්නේ මෙම පුද්ගලයා බවයි. ඔහු එම සමාගමෙහි ගිණුම් හරහා නොතාරිස්වරයාගේ වෘත්තීයමයභාවයට වසන් වී නොතාරිස්වරයා ඉදිරිපෙළ පුද්ගලයෙකු ලෙස භාවිත කරමින් නිශ්චල දේපළ මිලදී ගැනීම් සඳහා ගෙවීම් සිදු කර ඇත. පසු ව පරීක්ෂණවලින් හෙළි වූ පරිදි ඔහු බෙලිජියමේ සුප්‍රසිද්ධ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකි. (මූලාශ්‍රයඃ මූල්‍ය කාර්යය සාධන බලකායෙහි නිශ්චල දේපළ අංශය භාවිත කරමින් සිදුකරනු ලබන මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිළිබඳව සැකසුන වාර්තාව). නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාවාරමින් ඉපයූ අයථා මුදල් විශුද්ධිකරණය සඳහා ඔහු නිශ්චල දේපළ මිලදී ගත් අතර, එහි දී ස්වකීය අනන්‍යතාව වසන් කොට තබා ගැනීම සඳහා ව්‍යාපාර සමාගමකට මුවා වී නොතාරිස්වරයෙකුගේ වෘත්තීයමය සේවය ද අනිසි පරිදි භාවිත කරමින් මුදල් උපයාගත් මූලාශ්‍රය වසන් කිරීමට කටයුතු කර ඇත.

2.2 මැණික් හා ස්වර්ණාභරණ ගනුදෙනු භාවිත කරමින් මුදල් විශුද්ධිකරණය කිරීම

එසේම, නීත්‍යානුකූල නො වන ආර්ථික කටයුතුවලින් ඉපයූ මුදල් යොදා ගනිමින් ඉතා මිල අධික මැණික් හා ස්වර්ණාභරණ සහ වෙනත් අධි මිල ලෝහයන් ද, ගල් වර්ග ද, මිලදී ගැනීම සිදු කරනු ලබයි. නිදසුනක් ලෙස, බදු නොගෙවා පැහැර හරින ලද මුදල් භාවිතා කර මැණික් ගල් මිලදී ගැනීම සහ ඒවා ආභරණ ලෙස පැළඳගෙන ඉතා පහසුවෙන් රේගු නිලධාරීන්ගේ අවධානයෙන් මිදී රටකින් රටකට ගමන් කිරීම ද සිදුවේ. අවසානයේ එ කී රටේ දී එම මැණික් ගල් ඉතා අධික මුදලකට විකුණා සිය අයථා පරිද්දෙන් උත්පාදිත ධනය නැවත තමා සතු කර ගනියි.

මෙ වැනි නිදර්ශනයන්ගෙන් පෙනී යන ආකාරයට මුදල් විශුද්ධිකරණය විවිධාකාර ක්‍රම හරහා සිදුවන බවත්, නීති විරෝධී අයුරින් ඉපැයූ මුදල් ඍජු ව මූල්‍ය ආයතන හරහා විධිමත් ආර්ථික රාමුව තුළට ඇතුළු කරනවා වෙනුවට මැණික් හා ස්වර්ණාභරණ වැනි මූල්‍ය නොවන ව්‍යාපාර අංශ අවභාවිත කරමින් ඉතා සංකීර්ණ ගනුදෙනු මාලාවක් හරහා එකී මුදල් විධිමත් ආර්ථික පද්ධතියට එක් කිරීම සිදු කරනු ලබන බවත් මනා ව පෙනී යයි. මෙහි දී මූල්‍ය නොවන ව්‍යාපාර අංශ සහ වෘත්තිමය සේවාවන් ඔවුන්ගේ දැනීමෙන් හෝ දැනීමකින් තොර ව මෙ කී කටයුතුවලට යොදා ගන්නා බව ද පෙනී යයි.

2.3 කැසිනෝ ව්‍යාපාරයන්හි ගනුදෙනු අයථා අයුරින් මුදල් මුදල් විශුද්ධිකරණය සඳහා භාවිත කිරීම

කැසිනෝ වැනි සූදු ව්‍යාපාර ද නීතිමය නො වන අයුරින් ඉපැයූ මුදල් නීත්‍යානුකූල මුදල් බවට පත් කිරීමේ ක්‍රියාවලියට යොදා ගනු ලබන අවදානම් සහිත ව්‍යාපාර ගණයෙහි ලා සැලකෙයි. කැසිනෝ ව්‍යාපාරය ආශ්‍රය කරගෙන මුදල් විශුද්ධිකරණය සිදුවන ආකාරය කියවෙන ජගත් මට්ටමේ විෂය අධ්‍යයනයන් බොහොමයක් පවතී. කැසිනෝ ව්‍යාපාරය ගනුදෙනු සඳහා මුදල් තීව්‍ර ලෙස භාවිත කරන ව්‍යාපාරයක් බැවින් එම ගනුදෙනු හරහා මුදල් විශුද්ධිකරණය කිරීමෙහි අවධානම ද ඉහළ මට්ටමක පවතී. බොහෝ

ගනුදෙනුකරුවන් අත්පිට මුදලට මෙහි සූදු කටයුතුවල නිරත වෙයි. එසේ ම ගනුදෙනුවල මුදල් ප්‍රමාණයද ඉතා ඉහළ අගයක් ගනියි. එසේ ම මෙම ව්‍යාපාරයට විදේශීය ගනුදෙනුකරුවන්ගේ පැමිණීම ද ඉහළ මට්ටමක පවතින බැවින් කැසිනෝ සහ සූදු ව්‍යාපාරයන්හි මුදල් විශුද්ධිකරණ හැකියාව ද ඉහළ මට්ටමක පවතී. නිදසුනක් ලෙස මත්ද්‍රව්‍ය වෙළඳාමෙන් උපයනු ලබන කුඩා අගයන් සහිත මුදල් නෝට්ටු (රු. 20, රු. 50, රු. 100 වැනි) විශාල අගයන් සහිත මුදල් නෝට්ටු සඳහා හුවමාරු කිරීම වැනි කටයුතු සඳහා ද කැසිනෝ ව්‍යාපාර යොදා ගන්නා බවට තහවුරු වී ඇත. එ සේ ම ඇතැම් කැසිනෝ ව්‍යාපාර සිය ගනුදෙනුකරුවන් සඳහා පුද්ගල ගිණුම් පවත්වාගෙන යනු ලබන අතර එ කී ගිණුම් ද නීති විරෝධී අයුරින් ඉපැයූ මුදල් විවිධ ගිණුම් හරහා මාරු කර යැවීමේ කටයුතු සඳහා භාවිත කර ඇති බවට ද නිදර්ශන පවතී.

2.4 වෘත්තීයමය සේවාවන් මුදල් විශුද්ධිකරණය සඳහා අවභාවිත කිරීම

මුදල් විශුද්ධිකරණයෙහි නියැලෙන්නන්ගේ අවධානය යොමු ව ඇති ප්‍රධාන ම වෘත්තීය සේවාවන් ලෙස නීතිවේදීන්, ගණකාධිකාරීවරුන් සහ නොතාරිස්වරුන්ගේ වෘත්තීයමය සේවා හඳුනා ගෙන ඇත. මෙහි දී එ කී වෘත්තීය සේවා සපයනු ලබන්නන්ගේ අනුදැනුම මත (ඔවුනට ඒ සඳහා ගාස්තු ගෙවීමක් සිදු කොට) හෝ ඔවුන්ගේ කිසිදු අනුදැනුමක් නොමැති ව ම ඔවුන්ගේ වෘත්තීයමය පිළිගැනීම අවභාවිත කරමින් මෙම අයථා කටයුතු සඳහා මෙ කී සේවාවන් යොදා ගැනීම සිදු කෙරෙයි. නීතිවේදීන් සහ නොතාරිස්වරුන් හරහා ඉඩකඩම් සහ දේපළ මිලදී ගනු ලබන විට මෙන් ම වෙනත් ව්‍යාපාරවල මුදල් ආයෝජන ඔවුන් හරහා සිදු කරනු ලබන විට ඒ සඳහා භාවිත කරනු ලබන මුදල් උත්පාදනය කරනු ලැබූ මූලාශ්‍රය හෙළි කිරීමේ අවශ්‍යතාවක් නොතිබූ බැවින් ඔවුන් මෙකී සේවා අංශ මෙ ලෙස කුට අරමුණු සඳහා භාවිත කිරීමට පෙළඹී ඇත.

අයථා අයුරින් ඉපැයූ මුදලින් දේපළ මිලට ගෙන හෝ ව්‍යාපාරයන්හි ආයෝජනය කොට ඒවායෙහි කළමනාකාරීත්වය සහ පවත්වාගෙන යෑම ඒ සඳහා වන නෛතික භාවයකින් යුතු භාරකාරයන්ට පවරා දීම ද බහුලව සිදු වේ. මෙම භාරකාර සේවා සපයන ආයතන සඳහා ඊට අවශ්‍ය නෛතික තත්ත්වයන් පවතින බැවින් ඉතා පහසුවෙන් අයථා උත්පාදනයෙහි අග මුල සඟවා සිටීමට මුදල් විශුද්ධිකරණයෙහි නියැලෙන්නන්ට අවස්ථාව සැලසී ඇත. එ සේ ම එම දේපළවල හෝ ගනුදෙනුවල සැබෑ ප්‍රතිලාභියා සඟවා තබා ගැනීමට ද එය ඉවහල් වෙයි. නීතිඥවරුන් ද සිය සේවා දායකයන් වෙනුවෙන් භාරකාර සේවා සපයන අතර එ වැනි සේවාවන්ට මුවාවී නීතිමය නොවන අයුරින් උත්පාදිත ධනය ඒ බැව් සඟවා පවත්වාගෙන යෑමට මුදල් විශුද්ධිකරයෙහි නියැලෙන්නන්ට අවස්ථාව ඇත.

2.5 මූල්‍ය නොවන ව්‍යාපාර මාර්ගයෙන් සිදුවන මුදල් විශුද්ධිකරණය වැළැක්වීම

මෙ ලෙස මූල්‍ය නොවන ව්‍යාපාර අංශය භාවිතා කරමින් අයථා අයුරින් උත්පාදිත මුදල් සඳහා නීත්‍යානුකූලභාවයක් ආරෝපණය කිරීම තහනම් කෙරෙන නිර්දේශයන් මේ වන විට මූල්‍ය කාර්ය සාධක බලකාය (FATF) විසින් හඳුන්වා දී ඇත. ඒ අනුව, මූල්‍ය කාර්ය සාධක බලකායෙහි මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූල ඝාතක අවි ව්‍යාප්තිය වැළැක්වීම සම්බන්ධ ව ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ලොව පුරා එහි සියලු ම සාමාජික රටවල් සහ අනෙකුත් රටවල්, එනම් මූල්‍ය කාර්ය සාධක බලකායෙහි කලාපීය සංවිධානයන්හි සාමාජික රටවල්ද බැඳී සිටියි. එම නිර්දේශයන්ට අවනත වීම නිසි අයුරින් ක්‍රියාත්මක කිරීම මෙන් ම එ කී නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නීති රාමුව මෙන්ම ආයතනික පද්ධතිය සකසා දීම මගින් පහසුකම් සපයා දීමට ද රාජ්‍යයන් බැඳී සිටියි.

ඒ අනුව, මූල්‍ය කාර්ය සාධක බලකාය මුදල් විශුද්ධිකරණය වැළැක්වීම ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම සහ සමූල ඝාතක අවි ව්‍යාප්තිය වැළැක්වීම සඳහා මේ වන විට හඳුන්වා දී ඇති නිර්දේශ 40ක් සෑම රටක් ම එකඟතාවයෙන් යුතු ව පිළිපැදිය යුතු වේ. එ කී නිර්දේශ අතරින් ප්‍රධාන නිර්දේශ 3ක් (නිර්දේශ අංක 22, 23, සහ 28) සෘජු ව ම මූල්‍ය නොවන ව්‍යාපාර අංශය සඳහා බල පැවැත්වෙයි. එක් ප්‍රධාන නිර්දේශයන් යටතේ අනෙකුත් මූල්‍ය ව්‍යාපාර සඳහා බලපැවැත්වෙන නිර්දේශයන් ද අඩු වැඩි වශයෙන් මෙම මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීය අංශය කෙරෙහි බල පැවැත්වෙනු ඇත. මෙම නිර්දේශ ඒ ඒ රටවල් විසින් නිසි අයුරින් ක්‍රියාත්මක කරනවාද යන්න FATF ආයතනය විසින් වරින් වර ඇගැයීමට ලක් කරනු ඇත. එය එ සේ නොවන අවස්ථාවන්හි

දී එ වැනි රටවල් සඳහා ඊට විරුද්ධව දැඩි ක්‍රියාමාර්ග ගැනීමට ද එම ආයතනය ක්‍රියාත්මක වනු ඇත.

සාරාංශ ලෙස ගත් කල, මූල්‍ය නොවන ව්‍යාපාර (Designated non-Financial Business) ගනුදෙනුකරුවන් සමග මූල්‍ය ගනුදෙනු සිදු කිරීමේ දී ගනුදෙනුකරුවා හඳුනා ගැනීමට අවශ්‍ය වන පියවර ගැනීම නෛතික අවශ්‍යතාවක් වේ. ඒ අනුව මෙ කී ආයතන සහ වෘත්තීයමය සේවා සැපයුම්කරුවන් ගනුදෙනු සිදු කිරීමේ දී ගනුදෙනුකරු හඳුනා නො ගෙන ගනුදෙනු කිරීම වරදක් ලෙස සැලකෙයි. ගනුදෙනුකරු විසින් ප්‍රමාණවත් අයුරින් සිය අනන්‍යතාව ආයතනය වෙත ලබා දීම මෙහි දී කළ යුතු වෙයි. එ සේ ම, යම් ගනුදෙනුවක් හෝ එහි මුදල් උත්පාදන මූලාශ්‍රය පිළිබඳ එම මූල්‍ය නොවන ව්‍යාපාර ආයතනයන්ට යම් සැකයක් පවතී නම් එ වන් ගනුදෙනු පිළිබඳ ව එම රටෙහි මුදල් විශුද්ධිකරණය වළකාලනු වස් පිහිටුවා ඇති ආයතනයට සැකකටයුතු ගනුදෙනුවක් ලෙසට වාර්තා කිරීම ද සිදු කළ යුතු ව ඇත. ශ්‍රී ලංකාවේ මේ පිළිබඳ ව ක්‍රියාත්මක වන ආයතනය ශ්‍රී ලංකා මහ බැංකුවෙහි පිහිටුවා ඇති ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකයයි. වර්ෂ 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත ප්‍රකාර ව ශ්‍රී ලංකාව තුළ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම මූල්‍ය බුද්ධි ඒකකය විසින් සිදු කරනු ලබයි. ඒ අනුව ඉහතින් දැක්වූ යම් මූල්‍ය නොවන ව්‍යාපාරයක් හෝ වෘත්තීමය සේවා සපයනු ලබන ආයතනයක් මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතට පටහැනි ව ක්‍රියා කරයි නම් හෝ එකී නෛතික අවශ්‍යතාවන් නිසි අයුරින් ක්‍රියාත්මක නො කරයි නම් එවන් ආයතනයන්ට නීතිමය දඬුවම් නියම කිරීමට මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ මූල්‍ය බුද්ධි ඒකකය ක්‍රියාත්මක වනු ඇත.

මූලාශ්‍ර

1. ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකයේ වෙබ් අඩවිය
2. ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකයෙහි වාර්ෂික වාර්තාව - 2017
3. මූල්‍ය කාර්ය සාධන බලකායෙහි (FATF) මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීය සේවාවන් සපයන ආයතන සඳහා නිකුත් කර ඇති මාර්ගෝපදේශ ඇතුළත් වාර්තා සහ එම ආයතනයෙහි වර්ෂ 2012 මූල්‍ය කාර්ය සාධන බලකායෙහි (FATF) නිර්දේශ (වර්ෂ 2018 දී යාවත්කාලීන කරන ලද නිර්දේශයන්)
4. මුදල් විශුද්ධිකරණය සම්බන්ධ දිනපතා අන්තර්ජාලය ආශ්‍රිත ව පළවන පුවත් සහ විත්ති උදා. www.riskscreen.com - KYC 360

ඔබ දන්නවා ද?

ව්‍යවහාර මුදල් නෝට්ටු නිරූපණය වන පරිදි වෙළෙඳ දැන්වීම්, ප්‍රචාරණ කටයුතු, පත්‍රිකා, ප්‍රකාශන, භාණ්ඩ ආදී කිසිදු ප්‍රතිනිෂ්පාදන කටයුත්තක් ශ්‍රී ලංකා මහ බැංකුවේ අවසරයක් නොමැති ව සිදු කිරීම නීති විරෝධී බව

ඒ වැනි කටයුත්තක් සඳහා මුදල් නෝට්ටු නිරූපණය කිරීමේ අවශ්‍යතාවක් වේ නම් ඒ සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය හා මාර්ගෝපදේශයන් ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියෙන් ලබා ගන්න.

විමසීම්

ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01
දුරකථන : 0112477587 ෆැක්ස් : 0112477726
ඊමේල් : currency@cbsl.lk වෙබ් : www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදුව,
ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලදී.